# වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම්

## வருடாந்த செயலாற்றுகை அறிக்கையும் கணக்குகளும்

# Annual Performance Report & Accounts 2015




**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

உள்நாட்டலுவல்கள் அமைச்சு

**Ministry of Home Affairs**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# සහ ගිණුම්

## வருடாந்த செயலாற்றுகை அறிக்கையும்
## கணக்குகளும்

# Annual Performance Report
# & Accounts

# 2015

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

# පටුන


| | | |
|---|---|---|
| ❑ | හැඳින්වීම | 01 |
| ❑ | ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ පණිවුඩය | 02 |
| ❑ | ගරු ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | 03 |
| ❑ | ලේකම්තුමාගේ පණිවුඩය | 04 |
| ❑ | දැක්ම හා මෙහෙවර | 05 |
| ❑ | අරමුණු හා උපායමාර්ග | 06 |
| ❑ | මූලික කාර්යසාධන දර්ශක හා ප්‍රධාන කාර්යයන් | 07 |
| ❑ | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | 08 |
| ❑ | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල තොරතුරු | 09 |
| ❑ | කාර්ය මණ්ඩල සංයුතිය | 10 |
| ❑ | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අංශවල සුවිශේෂී කාර්යභාරය | 11 – 18 |
| ❑ | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 19 - 21 |
| ❑ | ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල පොදු දත්ත හා තොරතුරු | 22 - 37 |
| ❑ | ප්‍රගතිය | 38 - 58 |
| ❑ | ප්‍රසම්පාදන සැලැස්ම | 59 |
| ❑ | වාර්ෂික ගිණුම් වාර්තා 2015 | 60 – 68 |

## හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 1933/13 සහ 2015 සැප්තැම්බර් 21 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය අනුව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ස්ථාපනය කරනු ලැබ ඇත. සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති, දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය පරිපාලනය, ග්‍රාම පරිපාලනය, ග්‍රාම රාජ්‍ය පාලනය, සිවිල් ලියාපදිංචි කිරීම් සහ සේවක සුබසාධනය ආශ්‍රිත සේවාවන් සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය ඉටුකරනු ලැබේ. ඒ අනුව, රජයේ ජාතික ප්‍රමුඛතාවයන් හා සමගාමීව සමාජ හා ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගනිමින් සංවිධානමය කාර්ය සාධනය සුවිශිෂ්ටත්වය උදෙසා වන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය, විද්‍යුත් තාක්ෂණික ක්‍රම භාවිතය සහ යහපාලනය වැනි ක්ෂේත්‍ර ගණනාවක් සමඟ අමාත්‍යාංශය කටයුතු කරයි.



**වජිර අබේවර්ධන**
**(පාර්ලිමේන්තු මන්ත්‍රී)**
**ස්වදේශ කටයුතු අමාත්‍ය**

## මනුෂ්‍යත්වයෙන් සපිරි රාජ්‍ය සේවයක පෙර ගමන් කරුවන් වෙමු.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යනු මෙරට විශිෂ්ඨතම හා සුවිශේෂී අමාත්‍යාංශයක් ලෙස හැඳින්වීම නිවැරදිය. දිවයින පුරාම විධිමත් පරිපාලනමය ව්‍යුහයකින් සහ පුළුල් ජාලයකින් සමන්විත වූ මෙම අමාත්‍යාංශය මඟින්, දිස්ත්‍රික් සංවර්ධන, ප්‍රාදේශීය සංවර්ධන හා ග්‍රාමීය සංවර්ධන කාර්යයන් සඳහා පුළුල් දායකත්වයක් සපයා ඇත. එසේම සංවර්ධන ක්‍රියාදාමයන්හි මහඟු ප්‍රතිඵල, බිම් මට්ටම දක්වා ගෙනයාමටද ඉවහල් වී ඇත.

ජනතා පරමාධිපත්‍ය ඉටුවන පරිදි යහපාලන සංකල්පය කේන්ද්‍රකරගෙන රාජ්‍ය සේවකයින් විසින් රජයේ සැලසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කරගැනීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පුරවැසි අවශ්‍යතාවයන්ට වගවීමෙන් හා පාරදෘශ්‍යභාවයෙන් යුතුව ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හඳුනා ගත හැකිය.

අභිනව රජයේ වැඩ පිළිවෙල යටතේ එළිදැක්වීමට නියමිත ව්‍යවස්ථා සංශෝධන, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පාලනය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික සැලසුම් නිර්මාණයටත් අදාළ ප්‍රධානතම වගකීම පැවරී තිබෙන්නේ රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශය වන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයටය.

විසි එක්වන ශත වර්ෂයට ගැලපෙන පරිදි නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් මූල්‍ය ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් පුරවැසියන්ගේ බදු මුදල් වියදම් කරන ආකාරය සහ එහි කාර්ය සාධනය මැනීමට හැකිවන පරිදි 2015 වර්ෂයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව ප්‍රසිද්ධ කිරීම වැදගත් කාර්යයක් වේ. මෙම කාර්යසාධන වාර්තාව පුරවැසියන් විසින් පරිශීලනය කිරීම තුළින් අප වගවීමෙන්, පාරදෘශ්‍යභාවයකින්, ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කරන්නා වු කටයුතු පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිය උදා කර දෙනු ලැබේ.



**ඩබ්.ඒ. නිමල් ලන්සා**
**(පාර්ලිමේන්තු මන්ත්‍රී)**
**ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය**

## ජනහිතකාමී රාජ්‍ය සේවයක් උදෙසා කැපවෙමු.

ස්වදේශ කටයුතු අමාත්‍යාශයේ ප්‍රධාන දැක්ම මූලික කරගෙන, දශක තුනක කුරිරු යුද්ධයේ නිමාව සමඟම අරුණළු නැගෙනා උතුරේ මෙන්ම දකුණේ මහජනයා හට කාර්‍යක්ෂම වූ සේවාවක් ලබාදීමට අපි කැපවී සිටින්නෙමු.

ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට මාගේ පූර්ණ සහයෝගය ලබාදෙමින් හා එතුමාගේ මඟ පෙන්වීම යටතේ උපරිම කාර්‍යක්ෂමතාවයෙන් යුත් ගුණාත්මක රාජ්‍ය සේවාවක් ගොඩනැංවීම සඳහා වන ප්‍රයත්නයට මාගේ පූර්ණ දායකත්වය ලබාදීමට කැපවී සිටින බව සඳහන් කරනු කැමැත්තෙමි.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අරමුණු හා ඉලක්ක, අතීතයේ ලද අත්දැකීම් පදනම් කරගනිමින් වඩා ඵලදායී ලෙස උපාය මාර්ගිකව මෙහෙයවීමට අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලයත් අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්යය මණ්ඩලයත් රාජ්‍ය සේවයේ පෙර ගමන්කරුවන් වශයෙන් පෙළ ගැසී සිටින බව ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

එසේම ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සුවිශේෂී කාර්යභාරය නිරූපනය කිරීම සඳහා සකස් කරන ලද 2015 කාර්යයසාධන වාර්තාව එළිදැක්වීම තුළින් අමාත්‍යාංශය විසින් සිදු කරන්නා වූ කාර්යභාර්යයේ ගුණාත්මකභාවය පෙන්නුම් කිරීමේ අවස්ථාවක් උදා වී ඇත.



**ජේ.ජේ.රත්නසිරි**
**ලේකම්**
**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

## රාජ්‍ය සේවයේ යහපාලනය පෙරදැරි කරගත් හෙටක් වෙනුවෙන්.

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන දැක්ම, මෙහෙවර, අරමුණු සහ කාර්යයන් මුලික කර ගෙන නව අමාත්‍යාංශයක් ලෙස රාජ්‍ය සේවයේ උපක්‍රමික සැලසුම් උපයෝගී කර ගෙන නව මාවතක් අරභයා මහජනතාවට ඉතා සංවේදී සහ මහජනතාවට නැඹුරු වු රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම සඳහා අපි කැප වී සිටින්නෙමු.**

**පසුගිය වසර පුරාවට රාජ්‍ය අංශයේ කටයුතු විධිමත් කිරීමෙහි ලා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කල සේවය ඇගයිය යුතු වේ. ඒ සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි කාර්යාල විසින් විශිෂ්ඨ දායකත්වයක් ලබාදී ඇති බව සිහිපත් කරන්නේද ස්තූති පූර්වකවය.**

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුළුල් ජනතා සේවයක් වෙනුවෙන් කැප වී සිටියි. විසිඑක් වන ශතවර්ෂයට ගැලපෙන පරිදි ජනතා අපේක්ෂා ඉටුකිරීමෙහිලා සමීප සේවාවක් ලබාදීමට නවීන තොරතුරු තාක්‍ෂණය යොදා ගැනීමට කටයුතු කර තිබීම ද ඉතා ප්‍රතිඵලදායකය.**

**මෙතෙක් ආ මඟ තුළ අප ලත් අත්දැකීම් පෙරදැරි කරගෙන ඉදිරියටත් මහජනතාව වෙත කාර්යක්ෂමවූත්, ඵලදායීවූත් රාජ්‍ය සේවයක් ඉටු කිරීම සඳහා 2015 ජනවාරි මස සිට "ස්වදේශ කටයුතු අමාත්‍යාංශය" නමින් රටේ පරිපාලන ව්‍යුහය, යහපාලනය හා සංවර්ධනය සඳහා අප අමාත්‍යාංශයේ උපරිම දායකත්වය ලබා දී ඇත. රාජ්‍ය සේවයේ විශිෂ්ඨයන් වන ඔබගෙන් උදක්ම බලාපොරොත්තු වෙමි. තවද යහපාලන නව සංස්කෘතියක් තුලින් 2015 වර්ෂයේ කාර්යයසාධනය නිරූපනය කිරීම සඳහා සකස් කල කාර්යසාධන වාර්තාව එළිදැක්වීම මගින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විශිෂ්ටත්වය පෙන්නුම් කෙරේ.**

## දැක්ම

ජාතියේ උන්නතිය උදෙසා වන සුවිශේෂ සේවාවක් සැපයීම.

## මෙහෙවර

නිපුනතාවයෙන් හෙබි මානව සම්පත් උපයෝජනය සහිත ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රශස්ත පරිපාලන ක්‍රමයක් තුළින් විශිෂ්ඨතම සේවාවක් තහවුරු කිරීම.

## අරමුණු

1. ජනතාවට වඩා සමීපවූ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් සහිත දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය පරිපාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

2. ග්‍රාමීය, ප්‍රාදේශීය හා සමස්ථ ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා සහභාගීත්ව සහ සාමූහික ප්‍රවේශයක් ස්ථාපිත කිරීම.

3. ඒකාබද්ධ ප්‍රවේශයක් සහ ජනතාවට වඩා සමීප වූ රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.

4. නවීන තොරතුරු තාක්ෂණික සම්බන්ධතාවය ශක්තිමත් කරමින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය පරිපාලනය ශක්තිමත් කිරීම.

5. කාර්යක්ෂම , ඵලදායී හා ගුණාත්මක බව ඇතිවන පරිදි මානව සම්පත අභිප්‍රේරණය කිරීම.

## උපාය මාර්ග

1. මහජන වගකීම හා සංතෘප්තිය සහතික වන සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවිධාන ව්‍යුහයන් සරල කිරීම හා නැවත නිර්ණය කිරීම.

2. සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව එකම වහලක් යටතට පාලගත කිරීම.

3. සේවාලාභීන්ට හිතැති හා ප්‍රතිචාර දැක්විය හැකි සේ කාර්යාල පද්ධතිය වැඩිදියුණු කිරීම.

4. සෞඛ්‍යාත්මක ප්‍රවර්ධනාත්මක පරිසරයක් තුළ ආකර්ෂණීය ගෙවීම් පටිපාටියක් ඇතිකරමින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවකයන් බලගැන්වීම හා අභිප්‍රේරණය කිරීම.

## මූලික කාර්යයසාධන දර්ශක (KPI)

1. මානව සම්පත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය
2. අදාල නිලධාරි කණ්ඩායම් පුහුණු කිරීම සඳහා වැය කළ වාර්ෂික පුහුණු පැය ගණන.
3. දිස්ත්‍රික් / ප්‍රාදේශීය පරිපාලනයට අදාල මහජන පැමිණිලි / ඉල්ලීම් සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රතිශතය
4. උපත් / විවාහ / මරණ ආදී ලේඛණ නිකුත් කිරීම සඳහා ගතවන කාලයෙහි සාමාන්‍යය.

## ප්‍රධාන කාර්යයන්

1. **ස්වදේශ කටයුතු විෂයයට සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සියළු දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වල විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම පසු විපරම් කිරිම හා ඇගයීම.**
2. **රාජ්‍ය උත්සව සංවිධානය කිරිම**
3. **ග්‍රාම රාජ්‍ය කේන්ද්‍රයන්හි සීමා නිර්ණය කිරිම**
4. **ග්‍රාම රාජ්‍ය කේන්ද්‍ර මණ්ඩල පිහිටුවීම**
5. **දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ මණ්ඩල පිහිටුවීම**
6. **උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු සිදු කිරිම**
7. **රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සියළුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට පැවරී ඇති සියලුම විෂයන්ට අදාළ කටයුතු කිරිම**
8. **රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සියළුම දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි කාර්යාල අධීක්ෂණය කිරිම**

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



## ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර | අදාළ වන සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ලේකම් | | | 1 | 1 |
| 2 | අතිරේක ලේකම් (පාලන අංශය) | ශ්‍රී ලං.ප.සේ | විශේෂ | 1 | 1 |
| 3 | අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) | ශ්‍රී ලං.ප.සේ | විශේෂ | 1 | 1 |
| 4 | අතිරේක ලේකම් (සංවර්ධන/විමර්ශන ) | ශ්‍රී ලං.ප.සේ | විශේෂ | 1 | 1 |
| 5 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | ශ්‍රී ලං.ග.සේ | විශේෂ | 1 | 0 |
| 6 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලං.ප.සේ | 1 | 6 | 4 |
| 7 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලං.ග.සේ | 1 | 1 | 1 |
| 8 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ | 1 | 1 | 0 |
| 9 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං.ක්‍ර.සේ | 1 | 1 | 0 |
| 10 | සහකාර ලේකම් | ශ්‍රී ලං.ප.සේ | 111/11 | 8 | 6 |
| 11 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී ලං.ක්‍ර.සේ | 111/11 | 1 | 0 |
| 12 | ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ | 111/11 | 1 | 0 |
| 13 | සහකාර අධ්‍යක්ෂ | | | 1 | 0 |
| 14 | ගණකාධිකාරි | ශ්‍රී ලං.ග.සේ | 111/11 | 3 | 2 |
| 15 | අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ | 111/11 | 1 | 0 |
| 16 | නීති නිලධාරි | දෙපාර්මෙන්තුගත | 111/11 | 1 | 0 |
| 17 | පරිපාලන නිලධාරි | රා.ක.ප.සේ | අධි ශ්‍රේණිය | 1 | 1 |
| 18 | භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/සිංහල) | රජයේ.භාෂා.පරි.සේ | 11/1 | 3 | 1 |
| 19 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලං.තො.හා.සන් තා.සේ | 2 පන්තිය 11/1 ශ්‍රේණි | 2 | 1 |
| 20 | සංවර්ධන නිලධාරි | සං.නි.සේ | | 66 | 40 |
| 21 | විමර්ශන සහකාර | ආශ්‍රිත සේවා | | 10 | 12 |
| 22 | ලේකම්ගේ සම්බධිකරණ ලේකම් | තාවකාලික | | 1 | 1 |
| 23 | කාර්මික නිලධාරි | ශ්‍රී ලං.තා.සේ | 111/11/1 | 1 | 0 |
| 24 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලං.තො.හා.සන් තා.සේ | 3 පන්තිය 111/11/1ශ්‍රේණි | 5 | 1 |
| 25 | නිශ්චල ඡායාරූප ශිල්පි | තාවකාලික | | 1 | 0 |
| 26 | කැමරා ශිල්පි | තාවකාලික | | 1 | 0 |
| 27 | රියදුරු | ඒකාබද්ධ රි.සේවය | 111/11/1 විශේෂ | 12 | 12 |
| 28 | බංගලා භාරකරු | දෙපාර්මෙන්තුගත | 111/11/1 | 22 | 18 |
| 29 | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ | 111/11/1 විශේෂ | 21 | 20 |
| 30 | සහකාර බංගලා භාරකරු | දෙපාර්මෙන්තුගත | 111/11/1 | 15 | 05 |
| 31 | කැමරා ශිල්පි සහායක | තාවකාලික | | 1 | 0 |

## කාර්ය මණ්ඩල සංයුතිය




| ආයතන | A මාණ්ඩලිකශ්‍රේණි (ජ්‍යෙෂ්ඨ) | B මාණ්ඩලික ශ්‍රේණි (කණිෂ්ඨ) | C ඒකාබද්ධ සේවා ශ්‍රේණි | D කණිෂ්ඨ ශ්‍රේණි | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 529 | 1 | 17,766 | 63 | | 18,359 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 9 | 65 | 1,772 | 382 | | 2,228 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ | 51 | 27 | 1,152 | 120 | | 1,350 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 42 | 14 | 1,670 | 118 | | 1,844 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර | 46 | 21 | 1,309 | 148 | | 1,524 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 63 | 29 | 1,844 | 205 | 1 | 2,142 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | 45 | 18 | 1,084 | 109 | | 1,256 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය | 18 | 9 | 675 | 74 | | 776 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | 56 | 22 | 1,699 | 170 | | 1,947 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | 1 | 75 | 1,427 | 148 | 4 | 1,655 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට | 39 | 16 | 1,087 | 176 | 2 | 1,320 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය | 45 | 19 | 971 | 196 | 18 | 1,249 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මන්නාරම | 18 | | 262 | 42 | | 322 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව | 18 | 7 | 220 | 55 | | 300 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මුලතිව් | 17 | 2 | 197 | 45 | 1 | 262 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චිය | 14 | 1 | 223 | 52 | | 290 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව | 44 | 11 | 956 | 131 | 7 | 1,149 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | 58 | 4 | 1,075 | 243 | 5 | 1,385 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය | 33 | 15 | 448 | 119 | | 615 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 92 | 48 | 2,825 | 266 | | 3,231 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම | 34 | 109 | 790 | 137 | | 1,070 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය | 61 | 20 | 1,071 | 209 | 8 | 1,369 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව | 1 | 35 | 472 | 90 | 39 | 637 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල | 38 | 24 | 995 | 147 | | 1,204 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | 28 | 3 | 655 | 101 | | 787 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 61 | 17 | 1,206 | 185 | 10 | 1,479 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 38 | 22 | 998 | 109 | | 1,167 |
| | 1,499 | 634 | 44,849 | 3,840 | 95 | 50,917 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ වල සුවිශේෂී කාර්යභාරය

### පාලන අංශය

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ පාලන අංශය, ප්‍රධාන උප අංශ තුනකින් සමන්විත වේ. එනම්, මානව සම්පත් අංශය , තොරතුරු තාක්ෂණ අංශය සහ අභ්‍යන්තර පාලන අංශය ලෙස වේ.
ප්‍රධාන කාර්යයන්

- මානව සම්පත් කළමනාකරණය
- වාහන පාලනය හා නඩත්තුව පිළිබඳ කටයුතු කළමනාකරණය
- කාර්යාල කළමනාකරණය
- කාර්යාල ක්‍රම ඉහල නැංවීම සඳහා ඵලදායිතා කළමනාකරණය
- පෙරටු කාර්යාල කළමනාකරණ ක්‍රමය (Front Office Management System) සකස් කිරීම
- නවීන තොරතුරු තාක්ෂණික ක්‍රම ගුණාත්මකව සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම
- ජනතාවට වඩා සමීප වූ තොරතුරු ලබා ගැනීමේ නව ක්‍රම ස්ථාපිත කිරීම.
- අමාත්‍යාංශය යටතේ පවතින සියළුම කාර්යාල ජාලගතව සම්බන්ධීකරණය කිරීම

### මානව සම්පත් අංශය

ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල විදේශ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, තෝරා ගැනීම, පුද්ගල ධාරිතා සංවර්ධනය ඇතුළත් වේ.

### තොරතුරු තාක්ෂණ අංශය

නවීන තොරතුරු ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තොරතුරු හුවමාරු කරගැනීමේ උපාය මාර්ග පහසුකම ප්‍රධාන කාර්යයන් ලෙස හැඳින්වේ.

### අභ්‍යන්තර පාලන අංශය

අමාත්‍යාංශයේ මූලික හදවත ලෙස සැලකෙන පාලන අංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස වාහන නඩත්තු කටයුතු, අපද්‍රව්‍ය කලමණාකරනය, උපයෝගිතා, මානව සම්පත් කලමණාකරණය සහ ආයතනික කලමණාකරනය සම්බන්ධ වගකීම දරන අංශය ලෙස සැලකේ.





ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විදේශ දූත සාකච්ඡා






දිසාපති සමුළුව

## ස්වදේශ කටයුතු අංශය

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය පරිපාලනය, ග්‍රාමීය මට්ටමේ සේවා සම්පාදනය (ග්‍රාම සේවා පරිපාලනය) සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමන්විත වන අතර එය විමධ්‍යගත සේවා සම්පාදනය සහ සිවිල් පරිපාලන ලියාපදිංචිය සහ විමධ්‍යගත පරිපාලනය අධීක්ෂණය පිළිබඳව වගකීම දරනු ලැබේ.

විශිෂ්ඨ රාජ්‍ය සේවයක් සහතික කිරීම උදෙසා අත්‍යාවශ්‍ය වන්නා වූ කාර්යක්ෂම සහ ඵලදායී දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම පරිපාලනය, ග්‍රාම රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීමේ මූලික කාර්යභාරයද මෙම අංශය විසින් ඉටුකරනු ලැබේ.

## පළාත් අනුව පරිපාලන කාර්යාලවල සංඛ්‍යාත්මක සාරාංශ සටහනක්

| අනු අංකය | පළාත | දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | ග්‍රාම නිළධාරි කොට්ඨාශ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මධ්‍යම පළාත | 03 | 36 | 2224 |
| 02 | නැගෙනහිර පළාත | 03 | 46 | 1079 |
| 03 | උතුරු පළාත | 05 | 34 | 921 |
| 04 | උතුරු මැද පළාත | 02 | 29 | 989 |
| 05 | වයඹ පළාත | 02 | 46 | 2158 |
| 06 | සබරගමුව | 02 | 28 | 1148 |
| 07 | දකුණු පළාත | 03 | 47 | 2122 |
| 08 | බස්නාහිර පළාත | 03 | 40 | 2496 |
| 09 | ඌව පළාත | 02 | 26 | 886 |
| එකතුව | | 25 | 332 | 14023 |

## ජාතික නිදහස් උත්සවය - 2015














## ස්වදේශ කටයුතු අංශයේ ප්‍රධාන කාර්යයන්

- ස්වදේශ කටයුතු විෂයයට සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සියළු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වල විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම පසු විපරම් කිරිම හා ඇගයීම.
- රාජ්‍ය උත්සව සංවිධානය කිරිම
- ග්‍රාම රාජ්‍ය කේන්ද්‍රයන්හි සීමා නිර්ණය කිරිම
- ග්‍රාම රාජ්‍ය කේන්ද්‍ර මණ්ඩල පිහිටුවීම
- දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ මණ්ඩල පිහිටුවීම
- උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු සිදු කිරිම
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවල, සියළුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට පැවරී ඇති සියලුම විෂයන්ට අදාළ කටයුතු කිරිම
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි කාර්යාල අධීක්ෂණය කිරිම

## දිස්ත්‍රික් පාලන අංශය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල මානව සම්පත් කළමනාකරණය සහ අධීක්ෂණය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල කළමනාකරණය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ගැටළු කළමනාකරණය
- ජාතික සහ රාජ්‍ය උත්සව සංවිධානය කිරීම
- ජාතික ගීය, ජාතික කොඩිය සම්බන්ධව කටයුතු කිරීම සහ රජයේ නිවාඩු දින තීරණය කිරිම
- ශ්‍රී ලංකා ජනරජ ප්‍රමුඛතා ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම

## ප්‍රාදේශීය පාලන අංශය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මානව සම්පත් කළමනාකරණය සහ අධීක්ෂණය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භෞතික සම්පත් කළමනාකරණය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගැටළු කළමනාකරණය
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමා නිර්ණය
- ප්‍රාදේශීය පාලනයට අදාල වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය

## ග්‍රාම නිලධාරි පාලන අංශය

- ග්‍රාම නිලධාරීන් බඳවාගැනීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විශ්‍රාම ගැනීම සහ විනය කටයුතු හා සම්බන්ධ මානව සම්පත් කළමනාකරණය
- රජයේ සංචාරක නිවාස සම්බන්ධ කටයුතු කිරීම
- ග්‍රාම නිලධාරී කාර්යාල කළමනාකරණ තරග සංවිධානය සහ අධීක්ෂණය
- සේවා පියස ඉදිකරීම් කළමනාකරණය





ශ්‍රී ලංකා පරිපාලන ශ්‍රේණියේ නවක
නිලධාරීන් බඳවා ගැනීම





නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විවෘත
කිරීම

## විමර්ශන අංශය

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විමර්ශන අංශය යටතේ රෙජිට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී කාර්යාල යන ආයතනයන්හි විමර්ශන හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වගකීම දරයි. විමර්ශන අංශය මගින් අමාත්‍යාංශයීය ඉලක්කයන් හා අරමුණු කාර්යක්ෂම හා නිවැරදිව ඉටුකිරීම සහතික කරනු ලැබේ. විමර්ශන අංශය මගින් විධිමත්ව විමර්ශන කටයුතු සිදුකර ඔවුන්ගේ සොයාගැනීම්, යෝජනා හා නිර්දේශ සමඟ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි. මෙම විමර්ශන සඳහා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඇති අනෙකුත් ආයතනවල කාර්යයන් ද අවශ්‍යතාවය අනුව අධීක්ෂණය සහ විමර්ශනය කරනු ලැබේ.

## සංවර්ධන අංශය

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ නව ඉදිකිරීම් වලට අදාළ මූල්‍ය කටයුතු සිදු කිරීම, මග පෙන්වීම, දැනට තිබෙන ඉදිකිරීම් නඩත්තු කිරීම, ඉදිකිරීම් පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඉදිකිරීම් හා නඩත්තු සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම හා නිගමනයන් තුළින් පිරිවැය අඩු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම, නවීන විද්‍යාත්මක තාක්ෂණය යොදවා සේවා ලාභීන් සඳහා කාර්යක්ෂමව හා ඵලදායී සේවාවක් ලබාදීම පිණිස ගොඩනැගිලි ආශ්‍රිත භෞතික පරිසරයේ වෙනස්කිරීම් සිදු කිරීමට ව්‍යාපෘති යෝජනා සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට අදාළ මධ්‍ය කාලීන ආයෝජන සැලැස්මේ 2016 - 2018 කාර්යභාරය අධීක්ෂණය කිරීම වර්තමානයේ මෙම අංශයට අයත් කාර්යයන් වේ. ගැටුම් බලපැවැත්වූ ප්‍රදේශවල කඩිනම් ව්‍යාපෘති යටතේ යටිතල පහසුකම් නැංවීම පිණිස පරිපාලනමය ගොඩනැගිලි ඉදිකිරීම මූලික අරමුණ වූ අතර 2015 වර්ෂයේ පරිපාලනමය ගොඩනැගිලි 33ක් ඉදිකිරීම සම්බන්ධ කටයුතු මෙම අංශය යටතේ සිදුකර ඇත. එමෙන්ම මෙම අමාත්‍යාංශයට අයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, සේවා පියස කාර්යාලවල සැලසුම් ඉදිරිපත් කිරීම, ආයෝජන රැස්වීම් හා ඉදිකිරීම් ප්‍රගති සමාලෝචන රැස්වීම් සම්බන්ධීකරණය කිරීමද මෙම අංශයට පැවරී ඇත.

## මූල්‍ය අංශය

මූල්‍ය ක්‍රියාකාරකම් කාර්යක්ෂමව හා ඵලදායීව නවීන තාක්ෂණ ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් දිස්ත්‍රික් පරිපාලනය, ප්‍රාදේශීය පරිපාලනය, ග්‍රාම පරිපාලනය ශක්තිමත් කර දීමේදී ප්‍රධාන අංශයක් ලෙස මූල්‍ය අංශය හැඳින්විය හැක. මූල්‍ය අංශය උප අංශ පහකින් සමන්විත වන අතර, දිස්ත්‍රික් ගිණුම්, ප්‍රාදේශීය ගිණුම්, මූල්‍ය වාර්තාකරණ, වැටුප් හා ගෙවීම් සහ ප්‍රසම්පාදන අංශය වේ. නිශ්චිතව පවරා දෙනු ලබන විෂය පථයට අදාලව මුදල් රෙගුලාසි හා ඒ හා සම්බන්ධ සියළු නීතිරීති හා විධිවිධානයන්ට අනුකූලවන පරිදි ආයතනයේ ගිණුම්කරණ පද්ධතිය විධිමත්ව පවත්වාගෙන යාම, තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාල වන්නාවූ තොරතුරු වාර්තාකරණය හා ඒ සඳහා අදාල වන්නා වූ ගිණුම්කරණ හා ඊට අදාල තොරතුරු වාර්තා සකස් කිරීම හා ඒවා යාවත්කාලීනව පවත්වාගෙන යාම, ලැබීම්, ගෙවීම් සම්බන්ධ කටයුතු ඉටුකිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට සහායවීම, අනුබද්ධ ආයතන වල ගිණුම් කටයුතු හා සම්බන්ධව පවරා දෙනු ලබන කාර්යයන් හා ආයතනයේ ගිණුම්කරන ක්‍රියාවලියට අදාල වෙනත් කාර්යයන් වන කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, මූල්‍ය උපදෙස් හා මග පෙන්වීම, මූල්‍ය සැලසුම්කරණය හා අයවැය, ගිණුම්කරණය හා වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, වත්කම් කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණ, විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධ මූල්‍ය කළමනාකරණ උපදෙස් හා සුපරීක්ෂණය, මූල්‍ය ප්‍රතිපත්ති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය වගකීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාට හා මූල්‍ය කටයුතු වලට අදාලව පාර්ලිමේන්තුවට වගකිව යුතු කරුණු සඳහා සහාය වීම, අනුබද්ධ ආයතනවල මූල්‍ය කළමනාකරණ මග පෙන්වීම, සුපරීක්ෂණය හා උපදෙස් ලබාදීම හා මූල්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩල පුහුණුව යනාදිය සඳහන් කර ඇත.

## අභ්‍යන්තර විගණන අංශ

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි විගණන කටයුතු සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වගකීම් දරයි.

## නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉදිකිරීම



බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

**විශේෂ වැඩ සටහන් හා සේවාවන්**

- 2015 වර්ෂය තුළදී බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ හා අනෙකුත් සියලු පළාත් වල සේවය කරන අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර්වරුන් වෙනුවෙන් සිවිල් ලියාපදිංචිය හා ලේඛණ ලියාපදිංචිය පිළිබඳ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.
- 2015.03.27 දින ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවනාගාරයේදී දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුලුවක් පවත්වන ලදී.
- ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2015.06.09 දින ප්‍රගති සමාලෝචන රැස්වීම දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.

| ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල | | | | |
|---|---|---|---|---|
| 01. අම්පාර | 10. දෙල්කඳ / නුගේගොඩ | 19. යාපනය | 28. මතුගම | 37. නිකවැරටිය |
| 02. අනුරාධපුරය | 11. ඇල්පිටිය | 20. කළුතර | 29. මාතලේ | 38. පානදුර |
| 03. අත්තනගල්ල | 12. ඇඹිලිපිටිය | 21. කල්මුණේ | 30. මන්නාරම | 39. පුත්තලම |
| 04. අවිස්සාවේල්ල | 13. ගම්පොල | 22. කිළිනොච්චිය | 31. මාතර | 40. පේදුරුතුඩුව |
| 05. බදුල්ල | 14. ගම්පහ | 23. කුරුණෑගල | 32. මාරවිල | 41.පොළොන්නරුව |
| 06. බලපිටිය | 15. ගාල්ල | 24. කුලියාපිටිය | 33. මොණරාගල | 42. රත්නපුර |
| 07. මඩකලපුව | 16. හෝමාගම | 25. කෑගල්ල | 34. මුලතිව් | 43. තංගල්ල |
| 08. හලාවත | 17. හොරණ | 26. කොටපොල | 35. මීගමුව | 44. ත්‍රිකුණාමලය |
| 09. කොළඹ | 18. හම්බන්තොට | 27. මහනුවර | 36. නුවරඑළිය | 45. වවුනියාව |

### නව රෙජිස්ට්‍රාර්වරුන් සඳහා පත්වීම් ලබාදීම




### සිවිල් ලියාපදිංචි කිරීම

#### රෙජිස්ට්‍රාර්වරු

2015.12.31 දිනට සේවයේ යෙදී සිටි රෙජිස්ට්‍රාර්වරුන්ගේ ගණන1172 කි. ඔවුහු පහත සඳහන් වර්ග වලට අයත් වේ.

| | | |
|---|---|---|
| 1. | විවාහ , උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරු | 532 |
| 2. | විවාහ (අතිරේක) රෙජිස්ට්‍රාර්වරු | 345 |
| 3. | උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරු | 58 |
| 4. | උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු | 27 |
| 5. | මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරු | 295 |
| | මුළු ගණන | 1172 |

2015 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව

1) විවාහ - 175,939
2) උපත් - 334,821
3) මරණ - 131,614

## ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව




2015 වර්ෂය තුල ලියාපදිංචි කරන ලද විවාහ, උපත් හා මරණ සංඛ්‍යා 2014 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් 6.94%, 5.13% හා 11.32% කින් වැඩිවීමක් ද පෙන්වයි.

**2015 වර්ෂය තුල විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ, උප්පැන්න හා මරණ සංඛ්‍යාව**

1. විවාහ - 230
2. උපත් - 8,893
3. මරණ - 470

## විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව



# ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවලපොදු දත්ත හා තොරතුරු



## කොළඹ දිස්ත්‍රික්කය

බස්නාහිර පලාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කයක් වන කොළඹ දිස්ත්‍රික්කය වර්ග කි.මී. 675කින් යුක්තය. මෙහි මායිම් වශයෙන් උතුරින් කැළණි ගඟද, දකුණෙන් පානදුර බොල්ගොඩ ගඟද, බස්නාහිරින් මුහුදු තීරයද, නැගෙනහිරින් සබරගමු පලාත් මායිම්ද සීමා මායිම් කොට ගෙන පිහිටා ඇත. ලංකාවේ අගනුවර පිහිටි දිස්ත්‍රික්කය වන මෙහි ජනගහනය 2309199 ක් ජීවත්වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13කින් සමන්විත වේ. රාජ්‍ය අමාත්‍යාංශ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් මෙහෙය වීම කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වන අතර බස්නාහිර පළාත් සභාව සමගද සෘජු සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමද ඒ අතර ප්‍රධාන වේ. විශේෂයෙන්ම දිස්ත්‍රික්කයේ ආර්ථික සංවර්ධන කටයුතු මෙන්ම ආර්ථික, සමාජ, සංස්කෘතික හා සුබසාධන කටයුතු ද අමාත්‍යාංශ වලින් ලැබෙන ප්‍රතිපාදන ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබන අතර එමඟින් ජනතාවගේ ජීවන තත්වය ඵලදායී ලෙස නංවාලීම දැනට ක්‍රියාත්මක කොළඹ දිස්ත්‍රික් සංයුක්ත සැලැස්මේද ප්‍රධාන අරමුණ බවට පත්කර ඇත. කොළඹ දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාශ 13කින් සහ පලාත් පාලන ආයතන 15 කින් සමන්විතය.

## ගම්පහ දිස්ත්‍රික්කය

ගම්පහ දිස්ත්‍රික්කය පරිපාලන දිස්ත්‍රික් පනතේ 3 වන ඡේදය යටතේ 1978 සැප්තැම්බර් මස 07 වන දින ගැසට් නිවේදනය මඟින් නව දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුණි. මෙය කොළඹ දිස්ත්‍රික්කය නැවත බෙදීමෙන් වෙන් කරන ලද පාලන ප්‍රදේශයකි. ගම්පහ බැන්ඩියමුල්ල ප්‍රදේශයේ අග්‍රා ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූලස්ථානය කේන්ද්‍රකර ගත් උතුරින් මා ඔයෙන්ද (කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක) නැගෙනහිරින් මීටර් 100-200 උසකින්ද විහිදී යන වැටි හා නිම්න වලින්ද (කෑගල්ල දිස්ත්‍රික්කය) දකුණින් කැළණි ගඟ මායිම් වන කොළඹ දිස්ත්‍රික්කයෙන්ද, බටහිර ඉන්දියන් සාගරයෙන්ද, මායිම් වූ කිලෝ මීටර 45 දිගින් හා පළලින් යුත් හතරැස් බිම් කඩක් වශයෙන් පිහිටා ඇත.  සංස්කෘතික, දේශපාලන හා අධ්‍යාපනික ක්ෂේත්‍රයන්හි ගම්පහ දිස්ත්‍රික්කයට අද්විතීය ස්ථානයක් හිමි වෙයි. දිවයිනේ අග නගරය හා ජාත්‍යන්තර වරායට මුවදොර පිහිටි ගම්පහ දිස්ත්‍රික්කය නිෂ්පාදන කර්මාන්ත කේන්ද්‍ර කරගත් නිදහස් වෙළඳ කලාප, සංචාරක ව්‍යාපාරය සම්බන්ධවද ජාත්‍යන්තර ගුවන් තොටුපල, දුම්රිය හා මහා මාර්ග මෙන්ම විදුලි බලය හා දුරකථන වැනි යටිතල පහසුකම් අතින්ද විශේෂ වැදගත් කමක් උසුලයි. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර 1,387 (හෙක්ටයාර 139,140) භූමි ප්‍රමාණයකින් යුක්ත වන අතර කොළඹ දිස්ත්‍රික්කය මෙන් දෙගුණයක් විශාලත්වයක් දරයි. බස්නාහිර පළාතේ මුළු බිම් ප්‍රමාණයෙන් 38% හා ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 2.1% ආවරණය වේ. උතුරු අක්ෂාංශ 6 54"5 සහ 7 20 අතර හා නැගෙනහිර දේශාංශ 79 48.75 සහ 80 13 අතර පිහිටා ඇත. ගම්පහ දිස්ත්‍රික්කය 21.6C අවම උෂ්ණත්වයකින්ද 37C උපරිම උෂ්ණත්වයකින්ද මිලි මීටර් 1,750 පමණවූ සාමාන්‍ය වර්ෂාපතනයකින්ද (හෙනරත්ගොඩ 2,477 මිලි මීටර්) යුතු උෂ්ණ තෙත් කලාපීය දේශගුණයක් විදහාපාන භූමි ප්‍රදේශයකි.වැසි ලැබෙන්නේ අන්තර් මෝසම් සුළඟ සහිත කාල පරිච්ඡේදයේ හා නිරිත දිග මෝසම් සුළං කාලයේදීය.ජනවාරි සිට අප්‍රේල් මාස අතර කාලය දිස්ත්‍රික්කය පුරා වියළි දේශගුණයක් පවතී. ගම්පහ දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන උෂ්ණ තෙත් දේශගුණික තත්ත්වයන් මත තෙත් කලාපීය වෘක්ෂලතා ලක්ෂණ ඇතිවන ප්‍රදේශ හා වගුරු බිම් ආශ්‍රිත කඩොලාන වනාන්තර දැකිය හැක.

## කළුතර දිස්ත්‍රික්කය

බස්නාහිර පළාතේ පිහිටි කළුතර දිස්ත්‍රික්කයේ සාපේක්ෂ පිහිටීම සලකන විට උතුරින් කොළඹ දිස්ත්‍රික්කයටත්, නැගෙනහිරින් රත්නපුර දිස්ත්‍රික්කයටත්, දකුණින් ගාල්ල දිස්ත්‍රික්කයටත්, බටහිරින් සාගරයටත් මායිම් වේ. එහි නිරපේක්ෂ පිහිටීම දළ වශයන් උතුරු අක්ෂාංශ $6^{0}$ $19^{1}$ $30^{11}$ – $6^{0}$ $49^{1}$ $30^{11}$ සහ නැගෙනහිර දේශාංශ $79^{0}$ $51^{1}$ $30^{11}$ – $80^{0}$ $22^{1}$ $45^{11}$ වශයෙන් දැක්විය හැකිය. කෝරළ දෙකකින් , පත්තු අටකින් හා තොටමුණු දෙකකින් යුත් කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර සීමාව මධ්‍යම කඳුකරයෙන් පහත් වී එන කඳුවැටියට සම්බන්ධ වූ කඳුගැට කිහිපයකින් හා රැලි සහිත බිමෙන් යුතු වේ. මධ්‍යම කොටස හා බටහිර සීමාව වැඩි වශයෙන් තැනි බිම් සහිත වේ. නැගෙනහිර සීමාවෙන් ඇරඹෙන කළුගඟ හා බෙන්තර ගඟත් , අතු ගංඟා වන හික් ගඟ හා කුඩා ගඟත් මාවක් ඔයත් ප්‍රධාන වශයෙන් ජල ප්‍රවාහන රටා නිර්ණය කරයි. දිස්ත්‍රික්කයේ භූමි පරිහරණයෙන් වැඩි කොටසක ව්‍යාප්තව පැවති රබර් වගාවේ පරිහානියත් සමඟ දිස්ත්‍රික්කයේ කඳු සහිත කොටසට සීමා වී පැවති තේ වගාව දිස්ත්‍රික්කය පුරා වර්ධනය වීමක් සිදුවෙමින් පවතී. මීට අමතරව පොල්, කුරුඳු ගම්මිරිස් වැනි අපනයන බෝග වගාවන් මධ්‍ය කොටස්වල වේ. තැනිතලා සහ පහත් බිම් වල වී වගාව ව්‍යාප්තව ඇති අතර දිස්ත්‍රික්කයේ ගිණිකොණ දෙසින් පිහිටි සිංහරාජ වනය වනාන්තර ලක්ෂණ පිළිබිඹු කරයි. ඓතිහාසික අගයන් ඔපවත් කරන නටඹුන් අතර බුලත්සිංහල, පාහියංගල, පිහිටි ලෙන බලංගොඩ මානවයාගේ කාලීනයන් විසූ බවට කැනීම් තුලින් සාධක ලබා ගෙන ඇත. දෙවන පැතිස් රජ දවස රෝපණය කරන ලද තිස්දෙකක් වූ බෝ පැලවලින් එකක් ලෙසට කළුතර බෝධිය හා චෛත්‍යය ශ්‍රී ලාංකික බෞද්ධ, අබෞද්ධ බැතිමතුන්ගේ මෙන්ම විදේශ සංචාරකයින්ගේ ද භක්ත්‍යාදරයට පත් ඉපැරණි සිද්ධස්ථානයකි

## මහනුවර දිස්ත්‍රික්කය

මධ්‍යම පළාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රික්කය උතුරට මාතලේ දිස්ත්‍රික්කයෙන් ද නැගෙනහිරට බදුල්ල දිස්ත්‍රික්කයෙන් ද දකුණට නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් බස්නාහිරට කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ද මායිම්ව පිහිටා ඇත. දිස්ත්‍රික්කයට සම්පතක් වී ඇති සමනළ අඩවියේ උපන් මහවැලි නදිය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඔස්සේ ඟහවට කෝරලේ, කුණ්ඩසාලේ උඩ පළාත, දොළුව, උඩුනුවර, යටිනුවර, හාරිස්පත්තුව, කුණ්ඩසාලේ හා මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා ගලා බැස පසුව දිස්ත්‍රික්ක මායිමෙන් ගලා ගොස් මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා බදුල්ල දිස්ත්‍රික්කයට වැටේ. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20ක්ද ප්‍රාදේශීය සභා 17ක්ද ග්‍රාම නිලධාරී කොට්ඨාස 1188 කින්ද සමන්විත වේ.මනහර කඳුවැටි හා නිම්න භූමි වලින් සැඳුම්ලත් මහනුවර දිස්ත්‍රික්කය මධ්‍යම කඳුකරයේ වර්ග කිලෝමීටර් 1940ක භූමි ප්‍රමාණයක් වසා පැතිරී ඇති මනරම් භූමි භාගයකි. මහවැලි ගංඟාවට දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලින් ගලා එන ජල ධාරාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් එක් වේ. මීට අමතරව දැදුරු ඔයේ ආරම්භක ජල ධාරා ආරම්භවන්නේ ද පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙනි. දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩු නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල බටහිර බෑවුමෙන් ගලා යන ජලධාරා මා ඔයට එක් වී එහි ජලධාරාව වැඩි කරයි.

## මාතලේ දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ මධ්‍ය ප්‍රදේශය ලෙස සැලකෙන මාතලේ දිස්ත්‍රික්කය විශාලත්වයෙන් ව.කි.මී.1993.3 කින් සමන්විත වේ. මධ්‍යම පළාතේ උතුරු කොටස නියෝජනය කෙරෙන මාතලේ දිස්ත්‍රික්කයට උතුරෙන් අනුරාධපුරය ද නැගෙනහිරින් පොලොන්නරුව, බදුල්ල හා අම්පාර ද දකුණින් මහනුවර ද බටහිරින් කුරුණෑගල ද යන දිස්ත්‍රික්ක මායිම් වේ. දිවයිනේ ස්වභාවික සම්පත් වලින් අනූන ප්‍රදේශ වලින් එකකි. ලොව අති විශිෂ්ට නිර්මාණයක් වූ සීගිරිය ද සොබා දහමේ අපූර්වතම දායාදයක් වන නකල්ස් කඳු වැටිය ද පිහිටි මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක් පුරා විහිදුනු ගම්මාන 1373 කින් සමන්විත ලක්ෂ 04 කට අධික ජනගහනයක් වෙසෙන ප්‍රදේශයකි. කඳුකර පද්ධතියට අයත් කොටසයිට්ල පියුම් බන්ඩිත නයිස්, ග්‍රනයිට්, කැලික්නයිස්, ස්ඵටික හුණුගල් ඩොලයිට් හා කොණ්ඩලයිට් වර්ගයට අයත් ගානට්, සිලමනයිට්, ෂිස්ට් හා ග්‍රැපයිට් යන පාෂාණ වලින් මාතලේ දිස්ත්‍රික්කය සමන්විත වේ. දිස්ත්‍රික්කයේ වනාන්තර ව්‍යාප්තිය ද සංකීර්ණය. එහි මධ්‍ය නිරිත හා බටහිර ප්‍රදේශ කඳුකර තෙත් කලාපීය වනාන්තර ද උතුරු හා ලග්ගල - විල්ගමුව ප්‍රදේශ පහතරට වියළි කලාපීය වනාන්තර වලින්ද සමන්විත වේ.ප්‍රධාන මෝසම් සුළං වර්ෂා 2 මඟින්ම වර්ෂාව ලැබුවත් වැඩි වර්ෂාපතනයක් ලැබෙන්නේ ඊසාන දිග මෝසම් සුළං මඟිනි.නකල්ස් කඳු වැටිය අසල පුළුල් ජෛව විවිධත්වයක් පෙන්නුම් කරන අතර මෙය ලංකාවේ ප්‍රධාන දායාදයක් ලෙස සැලකිය හැකිය. හෝටන් තැන්නට බොහෝ සෙයින් සමාන එහෙත් විශාල නොමැති පතනයක් පිටවල ආශ්‍රිතව පිහිටා ඇති අතර කුඩා ලෝකාන්තයද එහි එක් කෙලවරක පිහිටා ඇත.

## නුවරඑළිය දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ පියස්ස යැයි විරුදාවලි ලබන නුවරඑළිය දිස්ත්‍රික්කය මහනුවර, බදුල්ල, කෑගල්ල, හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්ට මායිම්ව, මධ්‍යම පලාතේ පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට අඩි 900 සිට අඩි 8000 දක්වා උසට විහිදී යන ශ්‍රී ලංකාවේ උසම කන්ද වන පිදුරුතලාගල කන්ද මෙන්ම කිරිගල් පොත්ත කන්ද, කොටුපොල කන්ද , කිකිළියාමාන කන්ද, ග්‍රේට් වෙස්ටන් කන්ද ,හග්ගල කන්ද හා අති පූජණීය සමනල කන්ද ආදී කඳු පන්තිද නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත. එසේම ලක්ෂපාන ඇල්ල, ඩෙවෝන් ඇල්ල, ඇල්ජින් ඇල්ල, සෙන්ට් ක්ලේයා ඇල්ල, රම්බොඩ ඇල්ල, බේකස් ඇල්ල, කුරුඳු ඇල්ල, ගැරඩි ඇල්ල ආදියත් මහවැලි හා කැළණි ගංගාවල ආරම්භයත් එසේම දෙස් විදෙස් ප්‍රචලිත හෝර්ටන් තැන්න අභය භූමියත්, හග්ගල උද්‍යානයත් මෙහි පිහිටා තිබීම සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හේතුවී තිබේ. එසේම ශ්‍රී ලංකාවේ ජලවිදුලි බල උත්පාදනයට ප්‍රමුඛත්වයක් ගන්නා මාවුස්සා කැලේ, කාසල්රී, කැනියොන්, නෝර්ටන්බ්‍රිජ්, කොත්මලේ,රන්දෙණිගල යන ජලාශද, වික්ටෝරියා ජලාශයෙන් වැඩි කොටසක්ද පිහිටා ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළය. ජනගහනයෙන් 57.1% ක් පමණ ශ්‍රී ලංකා දෙමළ වන අතර, ඉතිරිය සිංහල හා අනෙකුත් ජාතීන්ගෙන් සමන්විත වේ. දිස්ත්‍රික්කයේ පවතින විශේෂිත දේශගුණික තත්වය කෘෂි කර්මාන්තයට හිතකර වන අතර වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ එළවළු බෝග වගාව සඳහාය.වර්ග කිලෝ මීටර් 1741 ක විශාලත්වයකින් යුක්ත මෙම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වර්ෂාපතනය අඟල් 75 ක් පමණ වන අතර, ලංකාවේ වැඩිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශය (වටවල) මෙන්ම අවම උෂ්ණත්වය වාර්තා වන ප්‍රදේශයද (නුවරඑළිය) මෙම දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබීම විශේෂත්වයකි. දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත, කොත්මලේ, වලපනේ වැනි ප්‍රදේශ හෙළ රජවරුන්ගේ ආරක්ෂක භූමි ලෙස පැවති අතර, එකල ඉදිවූ රජ මහා විහාර ආදිය මේ දක්වා සුරක්ෂිතව පවතී, මෙහි ඉතිහාසය රාවණා යුගය දක්වා දුරාතීතයට පැතිර යන බවට ජනප්‍රවාද මෙන්ම ඉතිහාස වාර්තාද සාක්ෂි දරයි.ඉහත කී ලක්ෂණ වලින් හෙබි නුවරඑළිය දිස්ත්‍රික්කය අඹගමුව,නුවරඑළිය, හඟුරන්කෙත ,කොත්මලේ හා වලපනේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහකින් සමන්විතවේ.

## ගාල්ල දිස්ත්‍රික්කය

ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි ප්‍රාදේශීය පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය වන්නේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි. දකුණු පළාතේ අග නගරය වන ගාල්ල නගරය වර්තමානය වන විට ඉතා ජනප්‍රිය මෙන්ම ජනාකීර්ණ නගරයක් බවට පත් ව ඇති අතර වේගයෙන් සංවර්ධනය වන නගරයකි. 1091000 ක් වන ජනගහනයක් මෙහි ජීවත් වන අතර ඔවුන් ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන් හඳුනා ගෙන ඒවා සඳහා විසඳුම් ලබා දීමේ සම්බන්ධීකරණ වැඩ පිළිවෙල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබයි. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවා සපයන ආයතන සහ නිෂ්පාදන ආයතන ලෙස කටයුතු කරන සුවිසල් ගොඩනැඟිලි රාශියක් කේන්ද්‍ර කර ගෙන ගාල්ල දිස්ත්‍රික්කයේ හදවත බඳු වූ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල නගරය පුරා විරාජමාන වී සිටී. ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ ගාල්ල ප්‍රධාන බස් නැවතුම්පොළට හා ගාල්ල ප්‍රධාන දුම්රිය ස්ථානයට සමීපව නවීන පන්නයේ සත් මහල් ප්‍රාසාදයක මෙම කාර්යාලය ස්ථාන ගත කර ඇත. මහජනතාවට තම සේවා අවශ්‍යතාවයන් සැණින් සපුරා ගත හැකි ලෙස ඉතා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක් මෙන්ම නවීන තාක්ෂණය අනුව කටයුතු කරමින් ඉක්මණින් මහජන අවශ්‍යාතාවයන් සපුරාදෙන ඉතා සුව පහසු දැකුම්කළු සේවා ආයතනයක් ලෙසද මෙය හැඳින්විය හැකිය. මහජනතාවට සඵලදායී කාර්යක්ෂම සේවාවන් රැසක් එකම වහළක් යටින් ලබා දීමේ ඒකායන අරමුණින් මධ්‍යම රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ ආයතන රාශියක් මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාන ගත කර ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළින් මහජනතාවට ලබා දෙන සේවාවන් සහ එම  සේවාව ලබා දීමට ගත වන කාලය සඳහන් කරමින් සකසන ලද සේවාලාභී ප්‍රඥප්තිය කාර්යාල පරිශ්‍රයේ බිම් මහලේ ප්‍රදර්ශනය කර ඇත. නූතන පරිගණක තාක්ෂණය  භාවිතා කරමින් වේගයෙන් කටයුතු කරන බැවින් සෑම නිළධාරියෙක්ම එම ප්‍රඥප්තියෙහි සඳහන් කාල පරාසය තුල ම තම සේවාව ඉටු කර දීමට බොහෝ සෙයින් උත්සුක වේ.

## මාතර දිස්ත්‍රික්කය

දකුණුලක නිල්වලා නදිය අසබඩ මහ සයුරට මායිම්ව පිහිටි මාතර දිස්ත්‍රික්කය, රෝහණ පුරවරයේ ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට මැදිව පිහිටා ඇති වර්ග කිලෝමීටර් 1282.5ක් හෙවත් හෙවත් හෙක්ටයාර් 128,250ක භූමි ප්‍රමාණයක වපසරියකින් යුක්ත සශ්‍රීක වු ආකර්ශනීය භූමි ප්‍රදේශයකි. උතුරු අක්ෂාංශ අංශක 5.8ත් 6.4ත් අතර නැගෙනහිර දේශාංශ 80.4ත් 80.7ත් අතර පිහිටි මාතර දිස්ත්‍රික්කය මිලි ලීටර්2553.2ක සාමාන්‍ය වර්ෂාපතනයකින් ද අංශක 26.7 සාමාන්‍ය උෂ්නත්වයකින් ද යුක්ත තෙත් කලාපීය දේශගුණයක් සහිත දිස්ත්‍රික්කයකි. ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 1.93% ක් අප දිස්ත්‍රික්කය සතුව ඇති අතර, දකුණු පළාතේ භූමි ප්‍රමාණයෙන් 23.14%ක් වශයෙන් මුළු බිම් ප්‍රමානය හැඳින්විය හැකිය. මාතර දිස්ත්‍රික්කය දකුණු වෙරළබඩ සිට උතුරේ අඩි 3880ක් දක්වා නැගීමක් පෙන්නුම් කරන අතර , උතුරේදී ලෝක උරුමයන් බවට පත්ව ඇති සිංහරාජ වනගහනයෙන් ආකර්ශනීය දිය ඇළි වලින් සමන්විත වේ. දකුණින් දර්ශනීය මුහුදු තීරයකින්ද, උතුරින් රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න, කලවාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද බටහිර ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව, ඉමදුව, යක්කලමුල්ල, තවලම නෙළුව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගෙන්ද නැගෙනහිරින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකේවෙල, බෙලිඅත්ත, කටුවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද මායිම්ව මාතර දිස්ත්‍රික්කය පිහිටා තිබේ.

### හම්බන්තොට දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ ගිනිකොණ දිග සීමාව පිහිටා ඇති හම්බන්තොට දිස්ත්‍රික්කය විශාලත්වයෙන් වර්ග කි.මී. 2609 කි. මෙය දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/25 පමණ වේ. දිස්ත්‍රික්කයේ උපරිම දිග කි.මී. 106 ක්ද උපරිම පළල කි.මී. 39 ක්ද වේ. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත්වන වෙරළබඩ තීරයේ දිග කි.මී. 151 කි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් ව.කි.මී. 11.5 ක්පමණ අභ්‍යන්තර ජලාශ වලින් වැසී ඇත.අක්ෂාංශ හා දේශාංශ පිහිටීම අනුව උතුරට 6 සිට 6.5 දක්වාද නැගෙනහිර දේශාංශ 80.6 සිට 81.7 දක්වා ද විහිදී ඇත. උතුරට මොණරාගල හා රත්නපුර දිස්ත්‍රික්කවලින්ද බටහිර මාතර දිස්ත්‍රික්කයෙන්ද දකුණට ඉන්දියන් සාගරයෙන්ද නැගෙනහිරට ඉන්දියන් සාගරයෙන් හා අම්පාර දිස්ත්‍රික්කයෙන්ද මෙම දිස්ත්‍රික්කය මායිම් වී ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති ස්වභාවධර්මයේ සුවිශේෂී දායාදයන් වන තංගල්ල ප්‍රා.ලේ. කොට්ඨාශයේ පිහිටි හුම්මානය හා සූරියවැව ප්‍රාදේශීය ලේකම් පිහිටි උණු දිය උල්පත් හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උසන්ගොඩ ප්‍රදේශය මෙරට දක්නට ඇති දුර්ලභ භූ විද්‍යාත්මක ලක්ෂණයන්ය. අම්බලන්තොටින් ඔබ්බෙහි පිහිටි මදුනාගල නම් සුපතල ආරණ්‍ය සේනාසනයට නුදුරින් මේ උණුදිය උල්පත් පිහිටා ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජලවහන රටාව ප්‍රධාන ගංගා සහ ස්වභාවික ජල මාර්ග 19 ක් පිහිටා ඇත. මේ අතරින් වලවේ ගඟ, කිරිදි ඔය, මැණික් ගඟ, ඌරුබොකු ඔය, හා කච්චිගල්ආර මෙන්ම දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිමේ පිහිටි කුඹුක්කන් ඔය ද ප්‍රධාන ජල මාර්ග වේ. මාස් කන්නය හෙවත් ඊසාන දිග මෝසම් කාලයේදී (නොවැ -මාර්තු ) මෙම ගංභාවල ජල මට්ටම ඉහළ යන අතර මාස් කන්නය හෙවත් නිරිත දිග මෝසම් කාලයේදී (මැයි - සැප්තැම්බර් ) ජල මට්ටම පහත බසී. දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන වැව් හා අභ්‍යන්තර ජලාශ 13 න් විශාලතම වැව රිදියගම වැව වුවද වැඩිම ජල ධාරිතාවක් අඩංගු වන්නේ මුරුතවෙල හා ලුණුගම්වෙහෙර යන ජලාශ වලය. වැඩි වැව් ප්‍රමාණයක් පිහිටා ඇත්තේ තිස්සමහාරාමය ප්‍රදේශය ආශ්‍රිතවය. දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන වශයෙන් වාරිමාර්ග සංවර්ධන යෝජනා ක්‍රම කිහිපයක් පසුගිය අවදියේ ක්‍රියාත්මක වී ඇත. උඩවලව සංවර්ධන ව්‍යාපාරය , කිරම ඔය ව්‍යාපාරය, ඌරුබොකු ඔය ව්‍යාපාරය , ලියන්ගස්තොට ව්‍යාපාරය , රිදියගම ව්‍යාපාරය ,ලුණුගම්වෙහෙර ව්‍යාපාරය, මව්ආර ව්‍යාපාරය සහ කැකිරිඔබඩ ව්‍යාපාරය මේවා අතර වේ. දිස්ත්‍රික්කයේ ඇති ගොවි ජනපද ව්‍යාපාර වශයෙන් මහගල් වැව , බඳගිරිය , බැරගම හා මුරුතවෙල ව්‍යාපාර දැක්විය හැකිය.

### යාපනය දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ උතුරු අග පිහිටි යාපනය දිස්ත්‍රික්කය කොළඹ සිට කි.මී. 410 කට එපිටින් පිහිටා ඇත.එය අර්ධද්වීපයකින් හා ජනයා වාසය කරන දිවයින් 07කින් සමන්විත වෙයි. දිස්ත්‍රික්කයේ උතුරු නැගෙනහිර හා බටහිර මායිම් වන්නේ ඉන්දියන් සාගරයට වන අතර දකුණින් යාපනය කලපුව හා කිලිනොච්චි දිස්ත්‍රික්කය වෙයි. දිවයිනද ඇතුළුව මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී. 1012.01 වන අතර යාපනය දිස්ත්‍රික්කය උප කොටස් හතරකට බෙදා ඇත. ඒවා නම් දිවයින්, වලිකාමම්, තෙන්මරච්චි හා වඩමාරච්චිය. දිස්ත්‍රික්කය පුරා පොකුණු 1084ක් හා අඟල් 2433ක් විසිරී පවතින අතර ඒවා වැසි ජලය සංරක්ෂණය කිරීමේ මාර්ග සහිත ඒවාය. අතිරික්ත ජලය ඉතා පහසුවෙන් මුහුදට/කලපුවට ගලායයි.මුහුදු මට්ටමේ සිට ඇති උස මෙපරිදිය. පේදුරුතුඩුව මී.15.24,මයිලිඩ්ඩි මී.10.8,වන්කනෙයි මී.3.04,කොකුවිල් මී.6.09.

## මන්නාරම දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ වයඹ දෙසින් උතුරට මන්නාරම දිස්ත්‍රික්කය පිහිටා ඇත.දිස්ත්‍රික්කයේ දකුණු දිශාවෙන් පුත්තලම දිස්ත්‍රික්කයද, ගිණිකොන දිශාවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයද, නැගෙනහිර දිශාවෙන් වවුනියා දිස්ත්‍රික්කයද, ඊසාන දිශාවෙන් මුලතිව් දිස්ත්‍රික්කය හා උතුරු දිශාවෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයද මායිම් ලෙස පිහිටා ඇත. තිරුකේදීශ්වරම් කෝවිළ, මරදු මඩු දේවස්ථානය, ඕලන්ද කොටුව, ආරිප්පු කොටුව, ආරුප්පු අල්ලිරාණි කොටුව, රාමා (ආදම්ගේ) පාලම, වැල් පාලම, බයෝබැබ් ගස හා ප්‍රදීපාගාරය දිස්ත්‍රික්කය තුළ වැදගත් ස්ථාන හඳුන්වා දිය හැකිය. මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වශයෙන් කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය හැඳින්විය හැකිය. 70% ක් කෘෂිකර්මය, 25% ක් ධීවර, 5% ක් වෙනත් රැකියාවල නිරත වන අතර 61.4% වී වගා කටයුතු වල යොමු වී සිටියි. ඉහත ආර්ථික කටයුතු සිදු කරනු ලබන පිරිමින් 70.5%ක් පමණ සිටී. වයස අවුරුදු 35 -39 දක්වා පිරිමින්ද, වයස අවුරුදු 25-29 අතර කාන්තාවන්ද, 5%ක් කිසිදු රැකියාවක් නොමැතිවද සිටී.

## වව්නියාව දිස්ත්‍රික්කය

මෙම දිස්ත්‍රික්කය නැගෙනහිරින් අනුරාධපුර දිස්ත්‍රික්කයටද, මුලතිව් දිස්ත්‍රික්කයටද, උතුරින් මුලතිව් දිස්ත්‍රික්කයට ද, බටහිරින් මන්නාරම දිස්ත්‍රික්කයටද, මුලතිව් දිස්ත්‍රික්කයේ කොටසකට ද, දකුණෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ද සීමා වී ඇත. ප්‍රසිද්ධ ඒ-9 මාර්ගය, කොළඹ කොටුවේ සිට කන්කසන්තුරේ දක්වා දිවෙන දුම්රිය මාර්ගයෙන් ද කොළඹ කොටුව සිට තලෛයිමන්නාරම් දක්වා දිවෙන දුම්රිය මාර්ගය ද මෙම දිස්ත්‍රික්කය හරහා පිහිටා ඇත. කනකරායන් කුලම් ආරු, පාලි ගඟ, පරංගි ගඟ යන ප්‍රධාන ගංගාවන් ද වෙනත් අතු ගංගාවන් ද මෙම දිස්ත්‍රික්ක හරහා ගලා බසී. ජල සම්පත් හා සාරවත් පසින් යුතු වවුනියා දිස්ත්‍රික්කය භූගෝලීය පිහිටීම අනුව කුඩා පරිමාණයේ පාෂාණ ස්ථරයකින් සමන්විතයි. මෙම දිස්ත්‍රික්කයේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් බවට පත් වුවද කුඩා ප්‍රමාණයේ කර්මාන්තයන් වන ඇඟළුම් නිෂ්පාදන, සත්ව පාලනය, වෙළදාම, යනාදි කර්මාන්තයන් ද පවත්වාගෙන යයි. අවශ්‍ය ප්‍රමාණයන්ටත් වඩා අධික ලෙස එකතුවන කිරි නිෂ්පාදනයෙන් වෙනත් කිරි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම වෙනුවෙන් පිට දිස්ත්‍රික්ක වලට යවනු ලැබේ. වී නිෂ්පාදනයෙන් මෙම දිස්ත්‍රික්කය ස්වයංපෝෂිත වු අතර අතිරේක නිෂ්පාදන වන වී සහ සහල් වශයෙන් වෙනත් දිස්ත්‍රික්කවලට රැගෙන යනු ලැබේ. දිස්ත්‍රික්කය තුල සමහර ප්‍රදේශවල ඇල දොළ ගංගාවන්හි කුඩා ප්‍රමාණයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය පවතින අතර විශාල වශයෙන් මුහුදු මාළු මන්නාරම්, මුලතිව්, ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්කවල සිට වවුනියාවට රැගෙන එනු ලැබේ. කෘෂිකර්මාන්තය, කුඩා පරිමාණ කර්මාන්තයන් වන පශු සම්පත් සත්ව පාලනය, වෙළදාම මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයන් වේ. රාජ්‍ය සේවයෙහි නියැලෙන නිලධාරින් මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි කරුවන් වේ.විවිධ වර්ගයේ මූල්‍යායතන වල ක්‍රියා කලාපයන් මෙම දිස්ත්‍රික්කයේ ඉතා විශිෂ්ඨ අන්දමින් පවත්වාගෙන යයි.

## මුලතිව් දිස්ත්‍රික්කය

1979 වර්ෂයේ දී අලුතින් පිහිටුවන ලද දිස්ත්‍රික්ක වලින් මුලතිව් දිස්ත්‍රික්කය එකක් ලෙස හැඳින්විය හැකිය. මන්නාරම, ත්‍රිකුණාමලය හා වවුනියා යන දිස්ත්‍රික්කවල කොටස්වලින් සමන්විත මෙම නව දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන් උතුරු පළාතේ නැගෙනහිර කොටස අඩංගු ප්‍රදේශයයි. මුලතිව් දිස්ත්‍රික්කයේ මායිම් වනුයේ උතුරින් කිලිනොච්චි දිස්ත්‍රික්කයද, දකුණින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයද, වවුනියා දිස්ත්‍රික්කය හා මන්නාරම් දිස්ත්‍රික්කයේ කොටසක් ද, බටහිරින් මන්නාරම් දිස්ත්‍රික්කය ද නැගෙනහිරින් මුහුද ද වේ. මෙම දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණය දළ වශයෙන් වර්ග කි.මී.25169ක් වන අතර (වනාන්තර ඇතිව හා විශාල අභ්‍යන්තර ජල ප්‍රදේශ හැර) රටේ භූමි ප්‍රමාණයෙන් 3.8%කි. සමතලා වූ මෙම ප්‍රදේශය උතුරු හා නැගෙනහිර දෙසට බෑවුම් ව ද බටහිර දෙසින් , දකුණ හා බටහිර දෙසට බෑවුම් ව ද පිහිටා ඇත.මෙම දිස්ත්‍රික්කයේ මුහුදු තීරය කි.මී.70ක් වන අතර, කෝකිලායි, නයාරු,නන්දිකඩාල් හා මාතලන් නැමැති ඉස්සන් බහුල කලපු හතරකින්ද සමන්විතය. මෙම දිස්ත්‍රික්කය මුහුදු මට්ටමේ සිට සාමාන්‍ය උස මීටර් 36.5ක් දක්වා වෙනස් වේ.ප්‍රදේශයේ පිහිටි රතු, දුඹුරු, මෙන්ම රතු, කහ පැහැති ලැටෝ වර්ගයේ පස වගාවට ඉතාමත් සුදුසු වේ. මෙම දිස්ත්‍රික්කයේ ඉඩම් හෙක්ටයාර් 251,690ක වනාන්තර ලඳු කැලෑ, කෘෂි බිම්, පොල් වගාව, ජනාවාස සහ ගොඩනැගිලි වැනි විවිධ කටයුතු සඳහා භාවිතා වේ. මෙයින් වනාන්තර වශයෙන් හෙක්ටයාර් 167,850ක් එනම් දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 64.1%කි. ජලයෙන් යට වී ඇති ප්‍රදේශ හා මුඩුබිම් වශයෙන් හෙක්ටයාර් 21,390ක් එනම් දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 5.2%ක් වශයෙන් ද, කෘෂි කර්මය සඳහා හෙක්ටයාර් 44,040ක් එනම් දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 5.1%ක් ද, ඉතිරි ප්‍රමාණය ජනාවාස හා ගොඩනැගිලි සඳහා ද භාවිතා වේ. මෙම දිස්ත්‍රික්කයේ මහා පරිමාණ වාරිමාර්ග 03ක් ද මධ්‍ය ප්‍රමාණයේ වාරිමාර්ග 16ක් ද කුඩා ප්‍රමාණයේ වාරිමාර්ග 198ක් ද පිහිටා ඇත.

## කිලිනොච්චි දිස්ත්‍රික්කය

යාපනය දිස්ත්‍රික්කය සමග ඒකාබද්ධව තිබූ කිලිනොච්චි ප්‍රදේශය නව දිස්ත්‍රික්කයක් ලෙස 1984 වන වර්ෂයේ පෙබරවාරි මස 3 වන දින ස්ථාපිත කරන ලදි. කිලිනොච්චිය කරඩිපෝක්කු හන්දියේ තිබෙන වී අලෙවි මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලේ පළමුවන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 1984.02.03 වන දින ආරම්භ කරන ලදී. 1985 වර්ෂයේ ඒ 9 පාරේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකර එහි කාර්යාලයන් ක්‍රියාත්මක වෙමින් පැවතුනේය.ඓතිහාසික වැදගත්කමකින් යුතු උරුත්තිපුරම් ශිවන් කෝවිල පුලියම්පොක්කනෙ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෙයි ශුද්ධ වූ අන්තෝනි මුනිඳු කිතුණු දේවස්ථානය, පාලයිතිවු ශුද්ධ වූ අන්තෝනි මුනිඳු දේවස්ථානය පොන්නාවේලි ශිවන් කෝවිල හා පුනකර් ඕලන්ද කොටුව ආදිය සැලකේ.ස්වාභාවික සම්පත් වන ඉරණමඩු වැව, චුණ්ඩික්කුලම් පක්ෂි අභය භූමිය , කෞදාරිමුනයි මුහුදු වෙරළ ආදිය පිහිටා ඇත. මෙම දිස්ත්‍රිත්කය දළ වශයෙන් වර්ග කිලෝ මීටර් 1237.11 බිම් කොටසකින්ද , වර්ග කිලෝ මීටර 44.3ක අභ්‍යන්තර ජල ප්‍රදේශයන්ගෙන්ද සමන්විත ව පිහිටා තිබේ. මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන රැකියාව කෘෂිකර්මාන්තය වේ. බහුතරයක් වී ගොවිතැනෙහි නිරත ව සිටින අතර, අනෙක් පිරිස් උප ආහාර භෝග වගාව, පළතුරු වගාව, ගව, එළු කුකුල් වැනි සත්ව පාලන රැකියාවන්වල ද යෙදී සිටිති. ඒ සමග ධීවර කර්මාන්තය දෙවැනි ස්ථානය ලගා කරගෙන මෙම ජනතාවගේ ජීවනෝපායට සහය වේ. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වාරිමාර්ග හා කෘෂිකර්ම වර්ධනය සලකා බැලීමේ දී, ඉරණමඩු වැව හා වාරිමාර්ග ව්‍යාපෘතිය ද ප්‍රධාන තැනක් ගන්නා අතර කිලිනොච්චියේ ජීවත් වන ජනතාවගේ ප්‍රාණය ලෙස ද පවතී. දිස්ත්‍රික්කයේ පදිංචි ව සිටින ගොවි පවුල් 21208 ක් ගොවි පවුල් 9495 ක් ඉරණමඩු ව්‍යාපෘතිය යටතේ ගොවිතැන් කටයුතු වල නිරත වන අයවලුන් වන අතර මෙය දිස්ත්‍රික්කයේ සම්පූර්ණ ගොවිපවුල් සංඛ්‍යාවෙන් 40% ක් වේ. තව ද ඉරණමඩු වාරිමාර්ග ව්‍යාපෘතියේ වී වගාව පමණක් නොව උප ධාන්‍ය වගාවන් වන කවුපි, උඳු, මුං වැනි දෑ ද වගා කර කෘෂිකර්මයෙන් සපිරි ස්ථානය කරා ගෙනයමින් කිලිනොච්චි දිස්ත්‍රික්කය දියුණු මාර්ගයක ගමන් කිරීම දැක ගත හැකි ව තිබේ. තව ද වැව් 464ක් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරමින් පවතී.

### මඩකලපුව දිස්ත්‍රික්කය

මෙය වෙරළ තීරයේ දිස්ත්‍රික්කයක් වන බැවින්, මුහුදු සම්පත් ප්‍රධාන සම්පතක් වශයෙන් දක්නට ලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08ක් ඇතුලත්ව ග්‍රාම නිලධාරී වසම් 76ක්ම පිහිටා ඇත්තේ වෙරළ තීරුවේය. මෙය වර්ග කි.මි.119.43 වේ. මෙම කළාපයේ ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපායෙන් එකක් ලෙස කරදිය ධීවර කර්මාන්තය දක්වති. එසේම දිස්ත්‍රික්කයේ නමට ගැලපෙන සේ කල්ලාරු සිට වාලච්චේනයි දක්වා වර්ග කි.මී.229.19ක අන්තර් ජලයෙන් සමන්විත ඉතා දිගු කලපුවක් පිහිටා ඇති අතර, මෙය දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 8.70% වේ. මඩකලපුව පැරණි වරාය නගරයක් ලෙස තිබුනු අතර, මෙහිදී භාවිතා කරනු ලැබූ ක්‍රේන් යන්ත්‍ර තවමත් ගාන්ධි උද්‍යානයේ කලපුව අසල දැකගැනීමට හැකිය. පාසිකුඩා වෙරළ රැළි නැති සුප්‍රසිද්ධ වෙරළ තීරයක් වන අතර, මෙය ශ්‍රී ලංකාවේ දේශිය හා විදේශීය සංචාරකයින්ගේ ප්‍රියතම වැදගත් සංචාරක ස්ථානයක් වේ. දිස්ත්‍රික්කයේ ප්‍රධාන වෘත්තියක් වන කුඹුරු වගාවට සුදුසු රොන්පස සංයුක්තය දිස්ත්‍රික්කයේ බටහිර දිසාවේ දක්නට ලැබේ.මෙය දිස්ත්‍රික්කයේ ස්වයංපෝෂිත වීමට හා හාල් නිෂ්පාදනය කරන ප්‍රධාන දිස්ත්‍රික්කයක් වීමටත් හේතුවක් වී ඇත

### අම්පාර දිස්ත්‍රික්කය

හෙක්ටයාර් 205,978ක් වූ ඉඩම් ප්‍රමාණයක් හා හෙක්ටයාර් 19280 ක් තරම් භූමි භාගයකට යට වූ අභ්‍යන්තර ජල තටාක වලින් සමන්විත වූ අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල, ද්‍රවිඩ , මුස්ලිම් යන ත්‍රිවිද ජාතීන්ම ජීවත් වේ. උතුරින් පොළොන්නරුව හා මඩකලපුව යන දිස්ත්‍රික්කවලටත් නැගෙනහිරින් ඉන්දියන් සාගරයටත් දකුණින් හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්ක වලටත් බටහිරින් බදුල්ල හා මාතලේ යන දිස්ත්‍රික්ක වලටත් මායිම් වන අම්පාර දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණයක් වර්ග කි.මි.4415කි. අම්පාර ආගමික හා සංස්කෘතික උරුමයන් පිළිබඳ ඓතිහාසික වටිනාකමක් සහිත දිස්ත්‍රික්කයකි. පියංගල, බුද්ධංගල වැනි ආරණ්‍ය සේනාසන ද රජගල,දිඝවාපිය, මඟුල් මහ විහාරය, මුහුදු මහ විහාරය, නීලගල සෑය හා කූඩුම්බිගල වැනි පුරා විද්‍යා වටිනාකමක් ඇති ආගමික සිද්ධාස්ථාන ද ඒ අතරින් වැදගත් තැනැක් ගනී. එසේම මහඔය හා පදියතලාව ප්‍රදේශවල ඇති උණු දිය උල්පත් ආරුගම්බේ මනරම් මුහුදු වෙරළ තීරයත් කතරගම වන්දනා කරන බැතිමතුන්ගේ පාද චාරිකාවේ යෙදෙන මාර්ගයත් පිහිටා තිබීම මෙම ප්‍රදේශයට සංචාරකයින්ගේ පැමිණීම වැඩි කරවන සාධක වේ. එසේම දිස්ත්‍රික්කයේ තැන තැන දක්නට ලැබෙන (පොල්ලේබැද්ද, හේනානිගල) ආදී වාසී ගම්මානද පැවතිම වෙනත් දිස්ත්‍රික්කවලට වඩා වෙනස් වූ සංස්කෘතියක දායාදයක් ලැබීම මෙම දිස්ත්‍රික්කය අතිශයින් මනරම් වූ දිස්ත්‍රික්කයක් විමට හේතු වේ. එසේම අම්පාර දිස්ත්‍රික්කය කල්මුණ මහ නගර සභාව, අම්පාර නගර සභාව ඇතුළුව නාමල්ඔය, උහන, දමන, මහඔය, පදියතලාව, දෙහිඅත්තකණ්ඩිය, ලාහුගල. සම්මන්තුර, අක්කරපත්තුව, අඩ්ඩාලචේන, ආලයඩිවෙම්බු, තිරුක්කෝවිල්, නාවිදන්වෙලී, එරගම , නින්දවුර්. කාර්තිව් හා පොතුවිල් යන ප්‍රාදේශීය සභා 17කින් සමන්විත වන සේ සංවිධානය වී ඇත.

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

දිගු ඓතිහාසික පසුබිමක් ඇති, ස්වභාවික වරායකින් යුතු, වෙළඳ, කෘෂිකාර්මික හා ධීවර වැනි ආර්ථික කටයුතුවලින් පිරිපුන් එමෙන්ම ස්වභාව සෞන්දර්යයෙන් අනූන ස්ථානවලින් සමන්විත ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පිහිටි දිස්ත්‍රික්කයකි. එය උතුරින් මුලතිවු දිස්ත්‍රික්කයෙන්ද බටහිරින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සහ දකුණින් මඩකලපුව හා පොළොන්නරුව දිස්ත්‍රික්කවලින් ද මායිම්ව පිහිටා තිබේ. ත්‍රිකුණාමලය ඉතිහාසය ස්මරණය කිරීමට අපහසු අතීතයක් දක්වා දිව යන්නකි. ලංකා ඉතිහාසයේ අනුරාධපුර යුගයේ ප්‍රකට ඉතිහාස ග්‍රන්ථ දෙකක් වන මහාවංශය හා චූලවංශය 'ගෝකණ්ණ', 'ගෝකර්ණ',සහ 'ගෝණගාමක' ලෙස ත්‍රිකුණාමලය හඳුන්වා ඇත. නැගෙනහිර පළාතේ පිහිටි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වර්ග කි.මී. 2,728.8 ක් පුරා විහිද ඇත.එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක් හා ග්‍රාමනිලධාරී කොට්ඨාශ 230 කින් සමන්විත වේ. කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්ය.වී වගාව ප්‍රධාන කෘෂි බෝගයයි.කන්තලේ වැව, වෙන්ඩ්‍රාස වැව, මොර වැව මහා දිවුල් වැව සහ පරවිකුලම එහි ප්‍රධාන වැව් කිහිපයකි. එමෙන්ම කන්තලේ, අල්ල කන්තලේ සහ මොරවැව ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති තුනකි. පශු සම්පත් හා ගව පාලනය තවත් ප්‍රධාන ජීවනෝපායකි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ලොව පතළ වෙරළ තීරයකින් සහ සංචාරක ස්ථානවලින් සමන්විත වීම නිසා සංචාරක කර්මාන්තය ද ආර්ථික වශයෙන් දිස්ත්‍රික්කය තුල වැදගත් කාර්යයක් ඉටු කරනු ලැබේ. තවද උපායමාර්ගික අතින් වැදගත් ස්ථානයක පිහිටීමත්, ස්වභාවිකව පිහිටි වරායත් නිසා ප්‍රිමා ශ්‍රී ලංකා සහ ටෝකියෝ සිමෙන්ති වැනි ජාත්‍යන්තර සමාගම් සිය නිෂ්පාදන හා බෙදාහැරීමේ මධ්‍යස්ථාන ත්‍රිකුණාමලය නගරය කේන්ද්‍ර කරගෙන පිහිටුවා තිබේ.

### කුරුණෑගල දිස්ත්‍රික්කය

වයඹ පලාත තුළ පිහිටා ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 4812.7කි. එනම් හෙක්ටයාර් 481270 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 කි. ග්‍රාමසේවා වසම් 1610 ක් අයත් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ගම්මාන සංඛ්‍යාව 4432 ක් වන අතර ජන්ද කොට්ඨාශ 14 කි. දිස්ත්‍රික්කයේ මහ නගර සභා 01 ක් හා නගර සභා 01ක් ඇත. ප්‍රාදේශීය සභා 18 කි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 6කි. පාසල් 875කි. මෙයින් 28ක් ජාතික පාසල් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ගුරුවරු සංඛ්‍යාව 20223 ක් වෙයි. සාපේක්ෂ වශයෙන් ගත් කල කුරුණෑගල දිස්ත්‍රික්කය, දිස්ත්‍රික්ක 5 කින් වටවී ඇත. එනම් උතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයත්, නැගෙනහිරින් මාතලේ දිස්ත්‍රික්කයත්, දකුණින් ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්කත්, බස්නාහිරින් පුත්තලම දිස්ත්‍රික්කයත් වේ. දිස්ත්‍රික්කයේ නිරපේක්ෂ පිහිටීම උතුරු බණ්ඩාංක 228-333සහ නැගෙනහිර බණ්ඩාංක 104-178 ක් අතර වෙයි. ඓතිහාසික පසුබිම පිළිබඳ කතා කරන විට කුරුණෑගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අන් දිස්ත්‍රික්ක වලට වඩා වැඩි සුවිශේෂී තාවයක් ගනී. එනම් රාජධානි 4ක් පැවති ලංකාවේ එකම දිස්ත්‍රික්කය ලෙස අභිමානයක් කුරුණෑගලට හිමිව තිබීමයි. පඬුවස්නුවර, කුරුණෑගල, යාපහුව, දඹදෙණිය එම රාජධානීන් වන අතර මෙම රාජධානි යුග වලදී කීර්තිමත් රජවරු රැසක්ම සිටි බවට සාක්ෂි ඕනෑතරම් හමුවේ. දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි ලීටර් 900-2200 අතර වෙයි. ඊසාන දිග මෝසම් සුළං හා නිරිත දිග මෝසම් සුළං හා සංවහන ක්‍රියාකාරීත්වය නිසා ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන අතර වැඩිම ප්‍රමාණයක් ලැබෙනුයේ නිරිත දිග මෝසම් සුළං ප්‍රවාහය මගිනි.

## පුත්තලම දිස්ත්‍රික්කය

ලාංකික වංශ කථාවේ නිජ භූමිය වූ පුත්තලම (තම්බපන්නී) දීර්ඝ ඉතිහාසයක් ඇති භූමිභාගයකි. පුත්තලම දිස්ත්‍රික්කය මුහුදු මට්ටමින් අඩි 300ට අඩු උසකින් පිහිටි බිම් තීරුවකි. උතුරින් කලා ඔයටද, නැගෙනහිරින් කුරුණෑගල දිස්ත්‍රික්කයටද, දකුණෙන් මා ඔයෙන් ද, බටහිරින් ඉන්දියන් සාගර වෙරළ තීරයෙන්ද සීමා වී පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය පිහිටා ඇත. දිස්ත්‍රික්කය තුල වැඩිම දිග කි.මී.120 වන අතර පළල කි.මී.50 පමණ වේ. දිගින් කි.මී.288 ක් වූ වෙරළබඩ තීරයෙන්ද අභ්‍යන්තර ජල පෝෂිත ප්‍රදේශ සමඟ ව.කි.මී.3072 භූමි ප්‍රමාණයක් මෙම දිස්ත්‍රික්කයට අයත් වේ. පොල් ත්‍රිකෝණයට අයත් පුත්තලම දිස්ත්‍රික්කය පොල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන අපනයනය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායකත්වයක් දක්වයි. එමෙන්ම අතීතයේ සිට පවතින වාරිමාර්ග පද්ධතිය නිසා වී ගොවිතැන මෙහි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී ඇත.

## අනුරාධපුර දිස්ත්‍රික්කය

බහු ආගමික, බහු භාෂික ජනතාවක් ජීවත්වන අනුරාධපුර දිස්ත්‍රික්කය උතුරින් වව්නියාව, මන්නාරම, මුලතිව් දිස්ත්‍රික්කවලින් ද , දකුණින් කුරුණෑගල, මාතලේ යන දිස්ත්‍රික්ක වලින් ද , බටහිරින් පුත්තලම හා මන්නාරම දිස්ත්‍රික්ක හා නැගෙනහිරින් පොළොන්නරුව හා ත්‍රිකුණාමළය යන දිස්තික්කවලින් සමන්විත අනුරාධපුර දිස්ත්‍රික්කයේ සීමාවන් පවතී. ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ ඇතුළු අටමස්ථානය ප්‍රමුඛ කොට අතිපූජ්‍යත්වයට පත් ඓතිහාසික උරුමයන්ගෙන් යුත් ස්ථාන මෙන්ම මිහින්තලේ රජමහා විහාරය, තන්තිරිමලේ රජමහා විහාරය, අවුකන පිළිමය ඇතුළු ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන රැසක් මෙම නගරය තුළ දර්ශනය වන අතර එම පසුබිම දෙස විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක්වී ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවෙනෝපාය කෘෂි කර්මාන්තය වන අතර වී ගොවිතැන ප්‍රධාන භෝගය වෙයි. අතිරේක භෝග වශයෙන් සෝයා, බඩ ඉරිඟු, උඳු , තල, ලොකු ළූණු වලින් දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවයන් සපුරා ගනී. මෙයින් බඩඉරිඟු හා සෝයා භෝගයන් ජාතික අවශ්‍යතාවය සම්පූර්ණ කර දීමට කටයුතු කරයි. අහස් දිය හා වාරි පද්ධතිය උපයෝගී කරගෙන වගාවට ජලය සපයා ගනී. වර්තමාන ඉංජිනේරු ක්ෂේත්‍රය පවා මවිත කරවන ඉපැරණි වාරි කළමණාකරණ තාක්ෂණ පද්ධතියකින් හෙබි මෙම දිස්ත්‍රික්කය තුළ කලාවැව, තිසාවැව, නුවරවැව, අභයවැව, නාච්චාදුව, රාජාංගනය හා පදවිය ඇතුළුව ප්‍රධාන වැව් 12 කින්ද, මධ්‍ය වැව් 85කින් ද , සුළු වැව් 2974කින් ද , වාරි පද්ධතිය සමන්විත වේ. ඉතා කුඩා පරිමාණයේ වැව් රාශියක් ද ඇත. අනුරාධපුර දිස්ත්‍රිකයේ ජනගහනය 856232ක් වේ.

### පොළොන්නරුව දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාද්විපයේ දෙවන රාජධානිය ලෙසින්, පැරකුම් රජු දවස සිට සිරිලක සහලින් ස්යවංපෝෂිත කළ ඓතිහාසික පොළොන්නරුව පුරවරය අද වන විට ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ 07කින් සහ ග්‍රාම නිලධාරී වසම් 295කින් සැදුම්ලත්, ආර්ථික මෙන්ම සෞන්දර්යාත්මක සම්පත් රැසකින් හෙබි පුන්‍ය භූමියක් ලෙස දේශිය ආර්ථිකයට දායක වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ උතුරු මැද පලාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල කි.මී.216ක් දුරින් මහවැලි මිටියාවතේ තැනිතලා භූමියක පිහිටි පොළොන්නරුව වූ කලී වර්තමාන දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයයි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී.3337.9කි. උතුරු අක්ෂාංක 7'40 "-8 '21" හා නැගෙනහිර දේශාංශ 80' 44" – 81' 20 " උන්නතාංශය අඩි 50-500කි. ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මාතලේ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වලින් මායිම්ව ඇත. දිස්ත්‍රික්කය පුරා ප්‍රධාන වැව් 04, මධ්‍යම ප්‍රමාණ වැව් 03, වැඩ කරන සුළු වැව් 62, වැඩ නොකරන සුළු වැව් 35 හා වැඩ කරන අමුණු 123 කිනුත් වැඩ නොකරන අමුණු 6 කිනුත් සමන්විතය.

### බදුල්ල දිස්ත්‍රික්කය

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පාලනය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කි. එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 තුළ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 567 ක් ඇති අතර, එම ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුළ ගම් 1996 ක් හා දෙමළ ජනතාව ජීවත් වන වතු(වැවිලි) 186 ක් ඇත. ප්‍රාදේශීය සභා 14ක්, නගර සභා 02 ක් හා මහ නගර සභා 01 ක් මෙම දිස්ත්‍රික්කය තුළ දේශපාලන හා පරිපාලනය හා සම්බන්ධව පවතී. දිස්ත්‍රික්කයේ පවුල් 227,428කට වැඩි සංඛ්‍යාවක් ඇති අතර, එම පවුල් වල මුලු ජනගහනය 811,758 ක් පමණ වේ.මෙම ජනගහනයෙන් 406,623 ක පිරිසක් සේවා නියුක්තව සිටින අතර, සේවා වියුක්තිකයන් සිටින සංඛ්‍යාව (ශ්‍රම බලකායට අයත්) 16,891 කි. බදුල්ල දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගෙන් වැඩි පිරිසකගේ ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. එනිසා, අඩු ආදායම් ලබන පිරිස ඉහළ මට්ටමක පවතී. රජයේ සමෘද්ධි වැඩසටහන යටතේ ආධාර ලබන සංඛ්‍යාව 59,273 කට ආසන්න වේ. විශ්‍රාම වැටුප් ලබන පිරිස 17,399 කට ආසන්න වේ.

### මොණරාගල දිස්ත්‍රික්කය

අතීතයේදී වෙල්ලස්ස ලෙස හැදින්වූ මොණරාගල දිස්ත්‍රික්කය ශ්‍රීලංකාවේ නැගෙනහිර හා ගිණිකොණ දිශානුගතව ඌව පළාත තුල පිහිටා ඇත.මුළු බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 5959 ක් වන අතර ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම දිස්ත්‍රික්කය වේ. නිරපේක්ෂ පිහිටීම අනුව උතුරු අක්ෂාංශ 6° 17' ත් 7° 28' ත් සහ නැගෙනහිර දේශාංශ 80° 50' ත් 81° 35' ත් අතර පිහිටා ඇති ස්වභාවික සම්පත් වලින් අනූන භූමි ප්‍රදේශයකි. මෙම දිස්ත්‍රික්කය නැගෙනහිරින් හා උතුරින් අම්පාර දිස්ත්‍රික්කයෙන්ද බටහිරින් හා උතුරින් බදුල්ල දිස්ත්‍රික්කයෙන්ද දකුණින් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්ද නිරිත දිගින් රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද මායිම් වී ඇත.මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කින් හා ග්‍රාම නිළධාරි වසම් 319 කින් ද ගම්මාන 1324 කින් සහ ප්‍රාදේශීය සභා 11 කින් සමන්විත වේ. සමස්ථයක් වශයෙන් මොණරාගල දිස්ත්‍රික්කය දේශගුණික කලාප බෙදීම අනුව අන්තර් මධ්‍ය දේශගුණික කලාපයට හා වියළි කලාපයට අයත්වේ. දිස්ත්‍රික්කයෙන් 70 % ක් පමණ වියළි දේශගුණික කලාපයට අයත් අතර මෙහි විශේෂත්වයක් වන්නේ දිස්ත්‍රික්කය මධ්‍යයේ පිහිටි මරගල කදුවැටිය ආශ්‍රිත ප්‍රදේශය තෙත් කලාපීය දේශගුණික ලක්ෂණ පෙන්වයි. මෙය මෙරට තුල පිහිටි සුවිශේෂී වූ දේශගුණික කලාපයකි. දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1625 ක් පමණ වන අතර දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් 26° ක් පමණ වේ.

## රත්නපුර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ නිරිත දෙසින් පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටීම, ඓතිහාසික හා භූගෝලීය වශයෙන් එහි වාසය කරන ජනතාවගේ පැවැත්මට හා ආර්ථික වර්ධනයට බෙහෙවින් බලපා තිබේ.උතුරු අක්ෂාංශ6 සිට 7 අතරද නැගෙනහිර දේශාංශ 80 සිට 81 අතරද පිහිටි රත්නපුර දිස්ත්‍රික්කය වර්ග ප්‍රමාණයෙන් වර්ග කිලෝ මීටර 3275.4කි. මෙම දිස්ත්‍රික්කය උතුරින් කෑගල්ල හා නුවරඑළි දිස්ත්‍රික්කද දකුණින් ගාල්ල මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කද බටහිරින් කොළඹ හා කළුතර දිස්ත්‍රික්කද නැගෙනහිරින් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක වලින් මායිම් වී ඇත. දැනට සොයාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව පැරණිතම මිනිසා එනම් බලංගොඩ මානවයා පිළිබඳ පාෂාණභූත ඇටසැකිළි සොයාගෙන ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ බටදොඹලෙන හා බෙල්ලන්බැඳි පැලැස්ස වැනි ස්ථාන වලිනි.අනුරාධපුර යුගයේ ඇතැම් ස්ථාන වලින් ලැබුණු බ්‍රාහ්මී අක්ෂර ගණයට වැටෙන අක්ෂරවලින් යුතු සෙල්ලිපි මෙම ප්‍රදේශයෙන් ද සොයාගෙන ඇති අතර ඇඹිලිපිටිය කල්තොට වැනි ප්‍රදේශවලින් ලැබී ඇති අනෙකුත් නටබුන් වලින්ද රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ඓතිහාසික වටිනාකම පැහැදිලිවේ. මහනුවර යුගය වන විට රත්නපුර දිස්ත්‍රික්කය කෝරළ 6 ට බෙදී තිබූ බව පෙනේ. ඒවා නම් කුරුවිට, නවදුන්, අටකලන්, කුකුළු, කඩවත්මැද හා කොලොන්න කෝරළය වේ. රත්නපුර දිස්ත්‍රික්කයේ කොඩිය කසාවත් මුතු පාට කොඩියකි. සබරගමුවේ පුරාණ කොඩියෙන් සකස්කර ගන්නා ලද මෙහි විසිතුරු රතු දාරයක් ද කසාවන් පසුතලයක් ද ඇත්තේය.කසා වර්ණය සමන්තකූඨාධිපති සමන් දිව්‍ය රාජයාණන්ට කැප කරන ලද වර්ණය වේ. දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන පූජණීය ස්ථානය ශ්‍රී පාදස්ථානය වේ. අවුරුද්දේ උඳුවප් පොහොය දිනෙන් ඇරඹෙන ශ්‍රී පාද වන්දනා සමය ඊළඟ වසරේ වෙසක් පුර පසලොස්වක පොහොය දක්වා පවතී. දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම විශාල පිරිසක් මෙම කාලය තුල වන්දනාව සඳහා මෙම ස්ථානයට පැමිණෙති. රත්නපුර සමන් දේවාලයද එවැනි ඓතිහාසික වටිනාකමක් ඇති තවත් වැදගත් පූජණීය ස්ථානයකි.

## කෑගල්ල දිස්ත්‍රික්කය

සබරගමු පළාතේ පිහිටි කෑගල්ල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකර ප්‍රදේශයත් නිරිත දිග තැනිතලා ප්‍රදේශයත් අතරමැද පිහිටි රමණීය පරිසරයකින් යුත් බිම් ප්‍රදේශයකි. රුහුණු, මායා, පිහිටි යන ත්‍රි සිංහලයෙන් මායා රටට අයත් ප්‍රදේශයකි. පරිපාලනමය වශයෙන් දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11කට බෙදා දක්වා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය උතුරු අක්ෂාංක 6.50 -7.20 සහ නැගෙනහිර දේශාංක 80.10ත් 80.35ත් අතර පිහිටා තිබේ. උතුරින් කුරුණෑගල දිස්ත්‍රික්කයද, දකුණින් රත්නපුර දිස්ත්‍රික්කයද, නැගෙනහිරින් මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වලින්ද, බටහිරින් ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක වලටද මායිම් වේ. කි.මී 48ක් වූ උතුරු දකුණු විහිදීමකින් ද යුත් මෙම ප්‍රදේශය ව.කි.මී.1692.8(ව.සැ.645)ක විශාලත්වයකින් යුක්ත වේ. ශ්‍රීලංකා ඉතිහාසයේ දේශපාලන ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික තොරතුරු විමසා බලන විට කෑගල්ල දිස්ත්‍රික්කය දෙවනි වනුයේ අනුරාධපුරය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලට පමණි. ශ්‍රී ලංකාවේ හොඳම මිනිරන් නිධිය කෑගල්ල දිස්ත්‍රික්කයේ බෝගල පිහිටා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය නිරිත දිග තෙත් කලාපයට අයත් වන අතර අධික වර්ෂාපතනයක් සහ අධික සූර්යතාපයක් ලැබෙන ප්‍රදේශයකි. මෝසම්, සංවහන හා වාසුළි මඟින් වර්ෂාව ලැබෙන බැවින් වර්ෂය පුරා ව්‍යාප්ත වූ වර්ෂාපතන රටාවක් දැකිය හැකිය.

## ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල පොදු දත්ත

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ග්‍රාම සේවා වසම් ගණන | ජනගහනය | ඡන්ද දායකයන් සංඛ්‍යාව | නගර සභා සංඛ්‍යාව | මහ නගර සභා සංඛ්‍යාව | ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන සංඛ්‍යාව (ජාතික ලැයිස්තු මන්ත්‍රී සංඛ්‍යාව හැර) | පළාත් සභා මන්ත්‍රී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 13 | 557 | 2,309,199 | 1,640,946 | 5 | 5 | 3 | 15 | 39 |
| 2 | ගම්පහ | 13 | 1177 | 2,304,833 | 1,637,537 | 5 | 2 | 12 | 18 | 42 |
| 3 | කළුතර | 14 | 762 | 1,250,000 | 919,375 | 4 | 0 | 13 | 8 | 22 |
| 4 | මහනුවර | 20 | 1188 | 1,416,000 | 1,073,809 | 4 | 1 | 17 | 13 | 29 |
| 5 | මාතලේ | 11 | 545 | 502,000 | 387,025 | 0 | 2 | 11 | 5 | 11 |
| 6 | නුවරඑළිය | 5 | 491 | 706,588 | 548,971 | 2 | 1 | 5 | 8 | 17 |
| 7 | ගාල්ල | 19 | 896 | 1,091,000 | 833,887 | 2 | 1 | 17 | 10 | 22 |
| 8 | මාතර | 16 | 650 | 837,000 | 634,918 | 1 | 1 | 15 | 10 | 14 |
| 9 | හම්බන්තොට | 12 | 576 | 596,617 | 365,829 | 1 | 1 | 10 | 7 | 13 |
| 10 | යාපනය | 15 | 435 | 618,209 | 457,939 | 3 | 1 | 13 | 7 | 16 |
| 11 | මන්නාරම | 5 | 153 | 161,604 | 83,224 | 1 | 0 | 5 | 6 | 5 |
| 12 | වවුනියාව | 4 | 102 | 189,402 | 112,808 | 1 | 0 | 4 | 6 | 7 |
| 13 | මුලතිව් | 6 | 136 | 132,834 | 67,169 | 0 | 0 | 4 | 0 | 5 |
| 14 | කිළිනොච්චි | 4 | 95 | 138,513 | 81,702 | 0 | 0 | 3 | 9 | 4 |
| 15 | මඩකළපුව | 14 | 345 | 588,359 | 377,906 | 2 | 1 | 9 | 3 | 11 |
| 16 | අම්පාර | 20 | 503 | 648,057 | 465,757 | 1 | 2 | 17 | 7 | 14 |
| 17 | ත්‍රිකුණාමලය | 12 | 230 | 423,181 | 256,852 | 2 | 0 | 11 | 4 | 10 |
| 18 | කුරුණෑගල | 30 | 1610 | 1,636,000 | 1,290,723 | 1 | 1 | 19 | 15 | 38 |
| 19 | පුත්තලම | 16 | 548 | 780,365 | 570,309 | 2 | 0 | 10 | 8 | 17 |
| 20 | අනුරාධපුරය | 22 | 694 | 856,231 | 653,151 | 0 | 1 | 18 | 9 | 22 |
| 21 | පොළොන්නරුව | 7 | 295 | 412,000 | 314,000 | 0 | 0 | 7 | 5 | 10 |
| 22 | බදුල්ල | 15 | 567 | 844,000 | 620,486 | 1 | 2 | 15 | 9 | 0 |
| 23 | මොණරාගල | 11 | 319 | 472,000 | 350,476 | 0 | 0 | 10 | 6 | 12 |
| 24 | රත්නපුර | 17 | 575 | 1,110,000 | 810,082 | 2 | 1 | 14 | 8 | 27 |
| 25 | කෑගල්ල | 11 | 573 | 836,606 | 661,001 | 1 | 0 | 11 | 11 | 18 |
| | එකතුව | 332 | 14022 | 20,860,598 | 15,215,882 | 41 | 23 | 273 | 207 | 425 |

දිස්ත්‍රික්ක අනුව ජනගහනය හා ඡන්දදායකයන් සංඛ්‍යාව



## දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් රැස්කළ ආදායම - 2015

රු.මිලියන

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 1003.07.02 රෙජිස්ට්‍රාර් ගාස්තු | 1003.07.03 දඩ ප්‍රවාහන ගාස්තු | 1003.07.05 බලපත්‍ර ගාස්තු | 1003.07.99 අනෙකුත් ගාස්තු | 2002.01.01 රජයේ ගොඩනැගිලි කුලී | 2002.02.99 ණය පොළී හා වෙනත් | 2003.02.13 විභාග හා අනෙකුත් ගාස්තු | 2003.02.14 මෝටර් රථ / අනෙකුත් ගාස්තු | 2003.02.99 විවිධ ලැබීම් | 2003.99.00 අනෙකුත් ලැබීම් | 2004.01.00 සමාජ සංරක්ෂණ දායක මුදල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 57.945 | 0.709 | 13.998 | 23.405 | 0.467 | 6.044 | 0.258 | * 0.296 | 28.641 | 101.369 | 27.148 |
| ගම්පහ | 36.041 | 0.739 | 1.079 | 11.59 | 0.536 | 9.127 | 0.115 | 171.853 | 7.577 | 23.097 | 39.867 |
| කළුතර | 23.286 | 1.344 | 0.274 | 7.288 | 0.72 | 8.028 | 0.06 | 65.589 | 5.472 | 14.504 | 32.488 |
| මහනුවර | 36.5 | 1.47 | 0.92 | 9.22 | 1.81 | 8.2 | 0.16 | 92.47 | 9.23 | 17.54 | 47.2 |
| මාතලේ | 11 | 0.6 | 0.3 | 0.4 | 1.8 | 4.3 | 0.04 | 42.1 | 2.1 | 10.7 | 22.4 |
| නුවරඑළිය | 11.985 | 0.406 | 0.129 | 3.689 | 2.451 | 3.352 | 0.026 | 31.316 | 4.888 | 11.59 | 16.073 |
| ගාල්ල | 26.76 | 1.12 | 0.15 | 6.28 | 1.26 | 8.64 | 0.14 | 58.7 | 1.04 | 18.17 | 41.87 |
| මාතර | 21.834 | 0.674 | 0.206 | 4.589 | 0.825 | 8.294 | 0.085 | 44.407 | 8.7 | 63.949 | 37.805 |
| හම්බන්තොට | 13.9 | 0.17 | 0.19 | 2.5 | 58.33 | 6.07 | 0.21 | 111.04 | 0.34 | 31.89 | 27.12 |
| යාපනය | 23.325 | 0.496 | 0.004 | 0.447 | 0.547 | 4.787 | 0.133 | 53.931 | 23.713 | 5.61 | 25.901 |
| මන්නාරම | 2.23 | 0.35 | 0.001 | 0.068 | 1.06 | 1.6 | 0.018 | 8.46 | 0.035 | 9.88 | 6.46 |
| වවුනියාව | 4.28 | 0.009 | 0.015 | 0.48 | 2.12 | 1.62 | 0.019 | 21.15 | 6.36 | 9.87 | 6.33 |
| මුලතිව් | 4.01 | 0.091 | 0.006 | 0.066 | 0.773 | 0 | 0.023 | 16.198 | 1.172 | 2.042 | 5.411 |
| කිළිනොච්චි | 3.804 | 0.054 | 0 | 0.054 | 0.849 | 1.884 | 0.017 | 15.459 | 10.926 | 2.246 | 6.37 |
| මඩකළපුව | 13.436 | 0.0004 | 0.93 | 0.991 | 1.506 | 5.604 | 0.113 | 44.244 | 0.116 | 10.522 | 21.909 |
| අම්පාර | 20.92 | 3.47 | 0.16 | 2.45 | 2.93 | 8.55 | 0.12 | 56.5 | 8.67 | 36.82 | 30 |
| ත්‍රිකුණාමලය | 12.934 | 0.041 | 0.046 | 1.171 | 2.166 | 3.581 | 0.203 | 34.086 | 6.33 | 14.099 | 13.008 |
| කුරුණෑගල | 37.27 | 2.47 | 0.51 | 20.03 | 1.86 | 11.36 | 0.2 | 241.11 | 0.75 | 58.84 | 68.21 |
| පුත්තලම | 20.542 | 0.38 | 0.862 | 14.401 | 1.491 | 0 | 0.14 | 47.087 | 2.25 | 14.629 | 24.395 |
| අනුරාධපුරය | 24.511 | 0.66 | 0.292 | 8.675 | 2.55 | 7.818 | 0.044 | 108.209 | 60.411 | 70.682 | 35.257 |
| පොළොන්නරුව | 8.402 | 0.136 | 0.1 | 5.119 | 1.977 | 3.424 | 0.022 | 27.862 | 0.248 | 6.283 | 12.097 |
| බදුල්ල | 23.5 | 0.75 | 0.157 | 4.9 | 2.89 | 3.01 | 0.043 | 48.99 | 22.05 | 0.877 | 25.14 |
| මොණරාගල | 11.66 | 0.82 | 0.19 | 3.58 | 2.06 | 4.11 | 0.03 | 38.99 | 0.15 | 58.47 | 16.5 |
| රත්නපුර | 24.8 | 0.47 | 1.36 | 11.46 | 1.19 | 7.76 | 0.07 | 63.38 | 8.78 | 6.24 | 29.58 |
| කෑගල්ල | 17 | 1 | 0 | 9 | 1 | 6 | 1 | 60 | 1 | 16 | 22 |
| එකතුව | 491.875 | 18.4294 | 21.879 | 151.853 | 95.168 | 133.163 | 3.289 | 1503.427 | 220.949 | 615.919 | 640.539 |

* කොළඹ දිස්ත්‍රික්යේ මෝටර් රථ බලපත්‍ර ගාස්තු ඇතුලත් නොවේ

දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් රැස්කළ ආදායම - 2015



# ප්‍රගතිය - 2015



## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
## ප්‍රගති වාර්තාව(මූල්‍ය හා භෞතික) - 2015

### ස්වදේශ කටයුතු අංශය - (දිස්ත්‍රික් පාලන/ප්‍රාදේශීය පාලන/ග්‍රාම නිලධාරී පාලන)

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධන දර්ශක | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) මූල්‍ය % | භෞතික% |
|---|---|---|---|---|---|---|---|
| නව තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් විශිෂ්ඨ සේවයක් උදෙසා දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාම පරිපාලන, ග්‍රාම රාජ්‍ය ස්ථාපනය කිරිම. | 1. සෑම සේවාවක් සඳහා පාරදෘශ්‍ය මාරු කිරීම් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | 1. අනුමත සේවක සංඛ්‍යා තොරතුරු පවත්වා ගැනීම.<br>2. පුරප්පාඩු පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම.<br>3. මානව සම්පත් සැලැස්ම සැකසීම.<br>4. අනුයුක්ත කිරීමේ ප්‍රතිපත්තිය සැකසීම. | කාර්යය මණ්ඩල සැලැස්මක් සකස් කිරීම | රැකියා අපේක්ෂකයින් සඳහා සාධාරණ, තරඟකාරී හා කුසලතා මත රාජ්‍ය සේවයට පත්වීම් ලැබීමේ අවස්ථා තහවුරු කිරීම. | මානව සම්පතේ ගුණාත්මක ප්‍රතිශතය. | 80 | 80 |
| | 2. විමධ්‍යගත පරිපාලනය සඳහා පුහුණු ක්‍රමෝපායයන් හඳුන්වාදීම. | 1. ඒ ඒ සේවාවන් වලට අදාලව පුහුණු අවශ්‍යතා සහ විෂය කරුණු හඳුනාගැනීම, පුහුණු වැඩසටහන් සකස් කිරීම හා සම්පත් දායකයන් හඳුනා ගැනීම. | පුහුණු සැලැස්මක් සකස් කිරීම | පුරවැසි සේවා කාර්යක්ෂමව සැපයීම සඳහා ඒකාබද්ධ සේවාවන්ට අදාල මානව සම්පත් සැපයීම තහවුරු කිරීම. | අදාළ කාර්යය සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය. | 70 | 70 |
| | | 2. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ පුහුණු පහසුකම් දියුණු කිරීම. | | | පුහුණු පහසුකම් වැඩි දියුණු කරන ලද කාර්යාල ප්‍රතිශතය. | 70 | 70 |
| | | 3. පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ පුහුණු ඒකක ශක්තිමත් කිරීම. | | | පිහිටුවන ලද පුහුණු ඒකක ගණන. | 70 | 70 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
## ප්‍රගති වාර්තාව(මූල්‍ය හා භෞතික) - 2015

**ස්වදේශ කටයුතු අංශය - (දිස්ත්‍රික් පාලන/ප්‍රාදේශිය පාලන/ග්‍රාම නිලධාරී පාලන)**

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධක දර්ශක | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) මූල්‍ය % | භෞතික% |
|---|---|---|---|---|---|---|---|
| රාජ්‍ය සේවාවේ යහපාලන මූලධර්ම පාදක කර ගත් රාජ්‍ය පරිපාලන යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | 1. අපක්ෂපාතිව හා විනිවිදභාවයෙන් යුක්තව විමර්ශන සිදුකිරීමේ ක්‍රමවේදය පවත්වාගෙන යාම.<br><br>2. රාජ්‍ය සේවකයන්ගේ දුර්වලතා හඳුනා ගැනීම හා ඒවා සකස් කර ගැනීමට ඔවුන් පෙළඹවීම<br><br>3. සේවාලාභීන් තෘප්තිමත් වන රාජ්‍ය සේවයක් පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා සකස් කිරීම. | 1. පැමිණිලි සම්බන්ධව විමර්ශන පවත්වා නිරීක්ෂණ/ නිර්දේශ පිළිබඳ අවශ්‍ය පියවර ගැනීම.<br>2. තත්වය පැමිණිලිකරුවන්ට දැනුම් දීම හා ඔවුන්ගේ ප්‍රතිචාර ලබාගැනීමේ ක්‍රම වේදයක් සකස් කිරීම.<br>3. විමර්ශන නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>4. ප්‍රාදේශීය ලේකම් කාර්යාල විමර්ශනය කර නිරීක්ෂණ නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම. | විමර්ෂණ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවෙන පරිදි සැලසුම් සකස් කිරීම | 1. ප්‍රශස්ත රාජ්‍ය සේවයක් සඳහා දායක නොවන්නන් හඳුනා ගැනීම හා ඔවුනට එරෙහි ක්‍රියා මාර්ග ගැනීම.<br><br>කාර්යක්ෂම හා මහජන හිතකාමී රාජ්‍ය සේවයක් නිර්මාණය තුළින් සේවාලාභීන් තෘප්තිමත් කිරීම. | පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය.<br><br>ලැබී ඇති පැමිණිලි වලින් නොවිසඳී පවත්නා පැමිණිලි වල ප්‍රතිශතය. | 70 | 70 |
| | 4. දිස්ත්‍රික් මට්ටමේ විමර්ශන ඒකක ශක්තිමත් කිරීම. | 1. කාර්ය මණ්ඩලය සඳහා මු.රෙ 71 අනුමැතිය ලබා ගැනීම. | | | කාර්යය මණ්ඩලය අනුමැතිය ලබා ගැනීමේ ප්‍රතිශතය. | 60 | 60 |
| | | 2. එම අනුමැතිය අනුව බඳවා ගැනීම සිදු කිරීම මගින් දිස්ත්‍රික්ක මට්ටමේ විමර්ශන ඒකක පිහිටුවීම. | | | දිස්ත්‍රික්ක මට්ටමේ විමර්ශන ඒකක පිහිටුවීමේ ප්‍රතිශතය. | 60 | 60 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
## ප්‍රගති වාර්තාව(මූල්‍ය හා භෞතික) - 2015

### ස්වදේශ කටයුතු අංශය - (දිස්ත්‍රික් පාලන/ප්‍රාදේශීය පාලන/ග්‍රාම නිලධාරී පාලන)

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධක දර්ශක | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | මූල්‍ය % | භෞතික% |
| ජනතාවට වඩා සමීප වූ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් සහිත විමධ්‍යගත පරිපාලන යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | 1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී වසම් සීමා නිර්ණය විධිමත් කිරීම. | 1. කමිටු වාර්තාව එළි දැක්වීමේ කටයුතු.<br>2. කමිටු වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ කටයුතු.<br>3. අනුමත කරන ලද සීමා නිර්ණ කමිටු වාර්තාවේ නිර්දේශ ගැසට් කිරීම.<br>4. අදාළ සංශෝධනයන් මැනුම් කටයුතු කිරීම හා සිතියම්ගත කිරීම. | ජනතාවට සමීප සේවයක් ලබාදීම සඳහා සීමා නිර්ණය සඳහා සැලසුම් සකස් කිරීම | ප්‍රාදේශීය ලේකම් / ග්‍රාම නිලධාරී කාර්යාල වල කටයුතු සිදුකිරීමේ පොදු ක්‍රමවේදයක් සකස් කිරීම තුළින් මහජනයාට පහසුකම් ඇති කිරීම. | කමිටු වාර්තාව එළිදැක්වීමේ අදාළ කටයුතු සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය.<br>2. කමිටු වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය.<br>3. ගැසට් කරන ලද ප්‍රතිශතය.<br>4. මැනුම් කරන ලද හා සිතියම් ගත කිරීමේ ප්‍රතිශතය. | 70 | 70 |
| ජනතාවට වඩා සමීප වූ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් සහිත විමධ්‍යගත පරිපාලන යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | 2. මහජනතාවට නිශ්චිත සේවා පහසුකම් ඇති කිරීම. | 1. නිශ්චිත සේවා පහසුකම් හඳුනාගැනීම. | ජනතාවට සමීපත් සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් සැලසුම් කිරීම | සේවාලාභීන්ට ලබාදෙන සේවාවේ ගුණාත්මක බව ඉහල නැංවීම | නිශ්චිත සේවා පහසුකම් හඳුනාගත් කාර්යාල ප්‍රතිශතය. | 60 | 60 |
| | | 2. සේවා පහසුකම් ලබාදීමට ක්‍රියා කිරීම. | | | 2. නිශ්චිත සේවා පහසුකම් ලබාදුන් කාර්යාල ප්‍රතිශතය. | 70 | 70 |
| | 3. සියලුම රාජ්‍ය සේවාවන් සඳහා විෂයානුබද්ධ අත්පොත් සකස් කර බෙදා හැරීම. | 1. නිශ්චිත විෂයයන් හඳුනාගැනීම. | | | 1. හඳුනාගත් විෂයයන් ගණන. | 70 | 70 |
| | | 2. අත්පොත් සකස් කර මුද්‍රණය කිරීම. | | | 2. මුද්‍රණය කරන ලද පොත් සංඛ්‍යාව. | 60 | 60 |
| | | 3. දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී කාර්යාල වලට බෙදා හැරීම. | | | 3. බෙදා හරින ලද පොත් සංඛ්‍යාව. | 65 | 65 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
## ප්‍රගති වාර්තාව(මූල්‍ය හා භෞතික) - 2015

### ස්වදේශ කටයුතු අංශය – (දිස්ත්‍රික් පාලන/ප්‍රාදේශීය පාලන/ග්‍රාම නිලධාරී පාලන)

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධක දර්ශක | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) මූල්‍ය % | භෞතික% |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිඵල ඉලක්ක කර ගත් කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවා සංස්කෘතියක් වෙත ප්‍රවේශය ලබා දීම. | 1. කාර්යාල පද්ධතිය හා සේවා සැපයුම් පද්ධතිය අධීක්ෂණ කටයුතු ක්‍රමවත් කිරීම | 1. අධීක්ෂණ සඳහා නිර්ණායක සකස් කිරීම හා සංශෝධනය කිරීම. | කාර්යාල අධීක්ෂණ ක්‍රමය පිළිබඳ සැලසුම් කිරීම | කාර්යාල අධීක්ෂණ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම. | 1. නිර්ණායක සකස් කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය. | 70 | 100 |
| | | 2. අධීක්ෂණ කණ්ඩායම් පත් කිරීම. | | | 2. අධීක්ෂණ කණ්ඩායම් පත් කිරීම පිළිබඳ කටයුතු සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය. | 60 | 100 |
| | | 3. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අධීක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම. | | | 3. අධීක්ෂණ කටයුතු සම්පූර්ණ කරන ලද කාර්යාල ප්‍රතිශතය. | 80 | 1 |
| | | 4. තරඟයේදී ලබා ගන්න ලකුණු සංඛ්‍යාව අනුව කාර්යාල වර්ගීකරණයකට ලක්කිරීම මගින් පහළ මට්ටමේ කාර්යාල වලටද ඉහල මට්ටමට පැමිණීම සඳහා පෙළඹවීමක් ඇති කිරීම. | | | 4. ඉහලම මට්ටමේ වර්ගීකරණයක් සහිත කාර්යාල ප්‍රතිශතය. | 70 | 75 |
| | | 5. කාර්යාල තත්ත්වය වැඩි දියුණු කල යුතු අවස්ථා හඳුනා ගැනීම සහ ඒ සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. | | | 5. පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව. | 80 | - |
| | | 6. නිශ්චිත කාලයක් තුල දිස්ත්‍රික් ලේකම් වරුන්, ප්‍රාදේශීය ලේකම් වරුන් හා අමාත්‍යාංශය මගින් පරීක්ෂා කලයුතු කාර්යාල සංඛ්‍යාවක් නියම කිරීම. | | | 6. නිශ්චිත කාලයක් පරීක්ෂා කරන ලද කාර්යාල ප්‍රතිශතය. | 65 | - |
| | 2. ඉලක්කගත සැලසුම් ක්‍රමවේදයක් ප්‍රාදේශීය පරිපාලනය තුල ස්ථාපිත කිරීම. | 1. අදාල ක්‍රමවේදය සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීම හා පුහුණු කිරීම. | ඉලක්කගත සැලසුම් කාර්යය සාධන ක්‍රමවේදයක් සැලසුම් කිරීම | සැලසුම්කරණ ය වඩාත් තාර්කික බව | 1. දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීම් සංඛ්‍යාව. | 60 | 100 |
| | | 2. එක් එක් දිස්ත්‍රික්ක වල වාර්ෂික සැලැස්ම ලබා ගැනීම. | | | 2. ලබාගන්නා ලද සැලසුම් ගණන. | 70 | 100 |
| | | 3. අඛණ්ඩ අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන යාන්ත්‍රණයක් පවත්වා ගැනීම. | | | 3. ළඟාකරගත් ඉලක්ක ප්‍රතිශතය. | 60 | 100 |
| | 3. ඉලක්කගත ප්‍රතිපල මත කාර්ය සාධන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | 1. ග්‍රාමීය මට්ටමේ වාර්ෂික ඉලක්ක හඳුනා ගැනීම. | | | 1. හඳුනාගත් ඉලක්ක ප්‍රමාණය. | 75 | 100 |
| | | 2. අඛණ්ඩ ඇගයුම් යාන්ත්‍රනය මගින් වාර්ෂික ඉලක්ක ළඟා කර ගැනීම. | | | 2. සම්පූර්ණ කරගත් ඉලක්ක ප්‍රමාණය. | 60 | 100 |
| | 4. ග්‍රාමීය මට්ටමේ සංවර්ධන තොරතුරු ජාලගත කිරීම. | ග්‍රාමීය මට්ටමේ සංවර්ධන තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් රැස්කිරීම. | | | අදාළ තොරතුරු රැස්කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන. | 80 | 100 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**සංවර්ධන අංශය**

## ප්‍රගති වාර්තාව(මුල්‍ය හා භෞතික) - 2015

| අරමුණ | උපායමාර්ග | ක්‍රියාකාරකම් | නිමැයුම් | අපේක්ෂිත ප්‍රතිලාභ | නිමැවුම් කාර්ය දර්ශකය | නිමැවුම් කාර්යසාධනය |
|---|---|---|---|---|---|---|
| භෞතික සම්පත් සැලසුම් කිරීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල භෞතික සම්පත් අවශ්‍යතාවයන් පාර්ශවකරුවන්ගේ ඵලදායි සහභාගිත්වයෙන් නිසිකල්හි හඳුනාගෙන භෞතික සම්පත් උපරිමයෙන් යොදාගැනීම තහවුරු කිරීම | 1.)දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සේවා පියස කාර්යාල වල ඉදිකිරීම් අවශ්‍යතා සම්බන්ධ යෝජනා ලබාගැනීම | ප්‍රතිපාදන ඉල්ලීම් යෝජනා | ප්‍රතිපාදන කාර්යක්ෂමව භාවිතය | 1.) ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය | 1.a)අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් 77.02% . ක් භාවිත ලදී.<br>1.b)දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා වෙන් කරන ලද වැය ශීර්ෂයෙන් 57.44% . ක් භාවිත ලදී. |
| | | 2.)අදාල අවශ්‍යතාවයන් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට යොමුකිරීම හා ප්‍රතිපාදන නිදහස් කරමින් ඉදිකිරීම් ආරම්භ කිරීමට දැන්වීම | 2.a)ප්‍රතිපාදන නිදහස්කිරීම | සේව්‍ය හා සේවක යන දෙපාර්ශවයම තෘප්තිමත් කිරීම | 2.a)ලබාදුන් ප්‍රතිපාදන වලින් නිදහස්කල ප්‍රතිපාදන % | 2.a)99.5% |
| | | | 2.b)ආරම්භ කළ කොන්ත්‍රාත් ප්‍රමාණය | | 2.b)වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත ඉදිකිරීම් වලට සාපේක්ෂව වැඩ ආරම්භ කළ ඉදිකිරීම් % | 2.b)100% |
| | | | 2.c) අවසන් කළ කොන්ත්‍රාත් ප්‍රමාණය | | 2.c) වැඩ නිම කිරීමට අපේක්ෂිත ඉදිකිරීම් ප්‍රමාණයට සාපේක්ෂව වැඩ නිම කළ ඉදිකිරීම් % | 2.c)56.94% |
| | | 3.)ප්‍රාග්ධන වියදම්(ඉදිකිරීම් සම්බන්ධ) ප්‍රගති වාර්තා අදාල ආයතන වලට යොමුකිරීම. | 3.)ප්‍රගති වාර්තා | ප්‍රතිපාදන හුවමාරු කිරීම හා ව්‍යාපෘති වෙනස් කිරීම් අවම කිරීම. | ඉදිරිපත් කළයුතු වාර්තා ප්‍රමාණයට සාපේක්ෂව ඉදිරිපත් කළ වාර්තා ප්‍රමාණය | 100% |
| | | 4.)සේව්‍යයාගේ ඉල්ලීම මත ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධ ගැටළු නිරාකරණය කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දැනුම් දීම. | 4.)කොන්ත්‍රාත් පිළිබඳව වන ආරවුල් නිරවුල් කිරීම,බේරුම් කිරීම හා පාර්ශවයන් ඉවත් කිරීම. | ඇපකර නැවත අයකර ගැනීම හා ආරවුල් බේරුම් කරනයට ඉදිරිපත් කිරීම | ආරම්භ කළ ව්‍යාපෘති ප්‍රමාණයෙන් මෙලෙස ගැටළු ඇතිවී ඇති ව්‍යාපෘති % | 2.08% |
| කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන පරිපාලනය | රු.මිලියන 100ට වැඩි කොන්ත්‍රාත් සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂම හා ඵලදායි ලෙස ඉටුකරමින් මුදලේ අගය තහවුරු කිරීම. | 1.)අමාත්‍ය මණ්ඩල පත්‍රිකා යොමුකිරීම | 1.)ප්‍රතිපාදන ඉල්ලීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා යොමුකිරීම | 1.)අනුමත වූ ප්‍රතිපාදන | 1.)ඉදිරිපත් වූ ඉල්ලීම් ප්‍රමාණයෙන් යොමු කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ප්‍රමාණය % | 50% |
| | | 2.)අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු,අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික කමිටු පිහිටුවීම | 2.)කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා යොමුකිරීම | 2.)අනුමත වූ ප්‍රදාන | 2.)මෙම වසර තුල ප්‍රදානයන් කළ ප්‍රසම්පාදන % | 100% |
| | | 3.)ප්‍රසම්පාදන ලේඛන සැකසීම හා සාකච්ඡා කැඳවීම. | 3.)ලංසු ලියවිලි | 3.)ප්‍රසම්පාදනය අවසන් කිරීම. | 3.)අපේක්ෂිත ප්‍රසම්පාදන ප්‍රමාණයෙන් නිමකළ ප්‍රසම්පාදන % | 100% |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

## ප්‍රගති වාර්තාව(මුල්‍ය හා භෞතික) - 2015

### මානව සම්පත් අංශය

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධක දර්ශක | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) මුල්‍ය % | භෞතික% |
|---|---|---|---|---|---|---|---|
| කාර්යක්ෂම, ඵලදායී හැකියාවෙන් කුසලතාවයෙන් පිරිපුන් මානව සම්පත් කාලීනව සැපයීම සහතික කිරීම සහ විෂයානුබද්ධ හා තාක්ෂණික කුසලතා හා හැකියාවන් සහිත රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම | දේශීය පුහුණු අවස්ථා පුළුල් කිරීම<br><br>මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම<br><br>මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම | 1. නිලධාරීන් පුහුණු අවශ්‍යතා පිළිබඳ අදාල විස්තර එක් රැස් කිරීම<br>2.ඉහත දත්ත විශ්ලේෂණය කිරීම<br>3.එක් එක් නිලධාරී ගණවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම<br>4.නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවලට අනුව විවිධ ආයතන සමඟ සම්බන්ධීකරණය කර පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම<br>5.පුහුණුවීම්වලින් අනතුරුව ලබාගත් ප්‍රතිඵල එක්රැස් කිරීම<br>6.එම ප්‍රතිඵල විශ්ලේෂණය කර ඇගයීම | මානව සම්පත පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම | නවීන කුසලතා සහ හැකියාවන්ගෙන් යුත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම | 1. යාවත්කාලීන කරන ලද පුහුණු අවශ්‍යතා පවත්වා ගැනීමේ ප්‍රතිශතය | 80 | 80 |
| | | | | | 2. පුහුණු අවශ්‍යතා සපුරා ගැනීමේ ප්‍රතිශතය | 70 | 70 |
| | | | | | 3. සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 70 | 70 |
| | | | | | 4.දේශීය පුහුණු වැඩ සටහන් සපුරා ගැනීම සඳහා වන මූල්‍යමය භාවිතය | 60 | 60 |
| | රාජ්‍ය සේවකයන් සඳහා විදේශ පුහුණු අවස්ථා ලබා දීම | 1.පුහුණුවීම්වලට අදාල පූර්ව සුදුසුකම් ඉල්ලා සිටීම සහ නිවැරදි අයදුම්කරුවන් උදෙසා මඟ පෙන්වා මාර්ගෝපදේශයක් සැපයීම.<br>2. අදාල නිලධාරීන් අතර පුහුණු අවස්ථා ව්‍යාප්ත කිරීම<br>3.පුහුණු වැඩසටහන් සඳහා වඩාත් සුදුසු නිලධාරීන් තෝරා ගැනීම<br>4.එක් එක් ප්‍රදේශයට අදාල ආවේණික ගැටළු විශ්ලේෂණය කිරීම හා ඒ අනුව පුහුණු අවස්ථා හඳුනාගැනීම<br>5.හඳුනාගත් පුහුණු අවශ්‍යතාවලට අනුව ව්‍යාපෘති වාර්තා සැකසීම<br>6.ප්‍රදායක නියෝජිත ආයතන සඳහා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම.<br>7.විදේශ පුහුණු අවස්ථා සැපයීම අපේක්ෂිත නිලධාරීන්ගේ තොරතුරු එක්රැස් කිරීම<br>8.දත්ත ගබඩාවට එම තොරතුරු ඇතුළු කිරීම<br>9.තොරතුරු යාවත්කාලීන කිරීම | මානව සම්පත් සම්බන්ධව පුහුණු ප්‍රතිපත්තියක් සකස් කිරීම | | 1.විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු විදේශ පුහුණු අවස්ථා සඳහා නම් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 60 | 60 |
| | | | | | 2.සකස් කරන ලද ව්‍යාපෘති වාර්තා සංඛ්‍යාව | 50 | 50 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

## ප්‍රගති වාර්තාව(මූල්‍ය හා භෞතික) - 2015

### අභ්‍යන්තර පාලන අංශය

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධක දර්ශක | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) මූල්‍ය % | භෞතික% |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිඵල ඉලක්ක කරගත් කාර්යක්ෂම හා ඵලදායී ප්‍රවේශය | සේවා ස්ථානයේ ප්‍රසන්න පරිසරයක් ඇති කිරීමට | 1. අමාත්‍යාංශයේ අලංකරණ කාර්යයන් කිරීම. | නවීකරණය හා අපහරණයට අදාල සැලසුම් සකස් කිරිම | ප්‍රසන්න සහ ආකර්ෂණීය වැඩ පරිසරයේ ගුණාත්මක වර්ධනය | ආවරණ කරන ලද භූමි ප්‍රමාණය ප්‍රතිශතය අනුව. | 50 | 50 |
| | | 2. අමාත්‍යාංශයේ අංශ නවීකරණය. | | | නවීකරණය කරන ලද ඒකක ප්‍රමාණ. | 60 | 60 |
| | | 3. අබලි ද්‍රව්‍ය අපහරණය. | | | පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ ගණන. | 60 | 60 |
| | | 4. ලේඛණාගාර කටයුතු විධිමත් කිරීම. | | | ගොනුවක් සොයා ගැනීමට ගත වන කාලය. | 50 | 50 |
| | අමාත්‍යාංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සැපයීම, නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම. | 1. පැරණි වාහන අපහරණය.<br>2. අලුතින් වාහන මිලදී ගැනීම. | වාහන භාවිතයට අදාල සැලසුම් සකස් කිරීම | 1. සේවකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම.<br>2. නාස්තිය වළක්වා ගනිමින් ආරක්ෂිත සේවා පරිසරයක් නිර්මාණය කිරීම. | අපහරණය කරණ ලද වාහන ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස.<br>මිලදී ගත් වාහන සංඛ්‍යාව. | 50 | 50 |
| | අමාත්‍යාශයේ සමස්ත ක්‍රියාවලීන් පිළිබඳ නිසි අධ්‍යයනය තුළින් ඒවායේ පවතින්නා වූ ගුණාත්මක බව ඉහළ නැංවීම හා ඉහළ ඵලදායීත්වයක් ඇති කිරීම | 1.මසකට වරක් කළමණාකරණ කමිටු රැස්වීම පවත්වා අමාත්‍යාංශයේ සමස්ත ක්‍රියාවලීන් සඳහා නව යෝජනා ගෙන ඒම, කළ යුතු කාර්යයන් සාකච්ඡා කිරීම හා කරන ලද කාර්යයන් ඇගයීම. | අමාත්‍යාංශයේ ගුණාත්මකභාවය බව ඉහළ නැංවීමට සැලසුම් සකස් කිරිම | අමාත්‍යාංශයේ සමස්ත පාලනය, මෙහෙයවීම හා ඇගයීම උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවීම. | පැවැත්වීමට අපේක්ෂිත රැස්වීම් ගණන. | -- | 80 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

## ප්‍රගති වාර්තාව(මුල්‍ය හා භෞතික) - 2015

### අභ්‍යන්තර පාලන අංශය

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධක දර්ශක | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) මූල්‍ය % | භෞතික% |
|---|---|---|---|---|---|---|---|
| සේවා සැපයීමේදී නවීන තොරතුරු තාක්ෂණ සම්බන්ධතාව ශක්තිමත් කරමින් මහජන සේවාවන් සරල කිරීම. | විද්‍යුත් තැපැල (e-mail) භාවිතය ව්‍යාප්ත කිරීම | විද්‍යුත් තැපැල සම්බන්ධව නිලධාරීන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම<br>• අවශ්‍යතාවන්ට සරිලන පරිදි e-mail පහසුකම් සලසා දීම<br>• විද්‍යුත් තැපැල් පද්ධතිය සම්බන්ධ නඩත්තු කටයුතු සිදු කිරීම. | විද්‍යුත් තැපැල භාවිතය වර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම | අභ්‍යන්තරික සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීම | නව විද්‍යුත් තැපැල් පහසුකම ලබාදීම | 50 | 50 |
| | තාක්ෂණික කාර්යයන් සඳහා සහයෝගය ලබාදීම. | • අභ්‍යන්තර දුරකථන පද්ධතියෙහි නඩත්තු කටයුතු | දුරකථන නඩත්තු සැලස්ම් සකස් කිරීම | අභ්‍යන්තරික සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීම | අභ්‍යන්තර නව දුරකථන සම්බන්ධතා ලබාදීම | 50 | 50 |
| | | • අභ්‍යන්තර ඇමතුම් පද්ධතියේ (Public Addressing System) නඩත්තු කටයුතු | | | ස්ථාපිත නව ඇමතුම් උපකරණ ලබාදීම | 50 | 50 |
| | නව මෘදුකාංග නිර්මාණය කිරීම | මෘදුකාංග අවශ්‍යතා හඳුනා ගැනීම<br>තැපැල් කළමනාකරණ පද්ධතිය (e-tappol) මෘදුකාංගය සකස් කිරීම.<br>ඉ-තැපැල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන චක්‍රලේඛ, උපදෙස් නිකුත් කිරීම<br>පුහුණු පාඨමාලා සංවිධානය කර අවශ්‍ය නිලධාරීන් පුහුණු කිරීම<br>ඉ-තැපැල ක්‍රියාත්මක භාවය අධීක්ෂණය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු හඳුනා ගැනීම හා එම ගැටළු අදාල අංශ හා ආයතන සමඟ සාකච්ඡා කොට විසඳුම් ලබාදීම<br>අවශ්‍ය අංශ සඳහා මෘදුකාංගය ඇතුලත් කිරීම | තැපැල් කළමණාකරණ පද්ධතිය භාවිතය වර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම | අභ්‍යන්තරික සේවාවන් වඩාත් කාර්යයක්ෂම කිරිම | තැපැල් කළමනාකරණ පද්ධතියේ භාවිතය | 50 | 50 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
## ප්‍රගති වාර්තාව(මූල්‍ය හා භෞතික) - 2015

### අභ්‍යන්තර විගණන අංශය

| අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | නිමවුම | අපේක්ෂිත ප්‍රතිලාභ | මූලික කාර්ය සාධක දර්ශකය | 2015 වර්ෂයේ ප්‍රගතිය (2015.12.31) මූල්‍ය % | භෞතික% |
|---|---|---|---|---|---|---|---|
| 1. ගිණුම්කරණ, මූල්‍ය හා අනෙකුත් අදාල පාලන මාර්ගවල සාර්ථකත්වය, ප්‍රමාණවත්භාවය හා භාවිතය | සැලසුම් කිරීම | වාර්ෂික සැලැස්ම ඉදිරිපත්කිරීම<br><br>විගණන වැඩසටහන් සැකසීම | වාර්ෂික සැලසුම් සකස් කිරීම | අවදානම් කළමනාකරණ, පාලන මාර්ග හා පාලන කියාවලියේ ඵලදායීතාව ඉහළ නැංවීම | කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවෙන් නියම කර ඇති දිනයට පෙර විගණන වැඩසටහන් ඉදිරිපත් කිරීම | 70 | 70 |
